ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

වාර්ෂික වාර්තාව 2024

ආයතනික තොරතුරු

ආයතනය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

අමාත්‍යාංශය

අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
වෘත්තීය අධ්‍යාපන අංශය

ලිපිනය

නිපුණතා පියස
නො 354/2, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

ඊ මේල් ලිපිනය

info@vtasl.gov.lk

වෙබ් අඩවිය

www.vtasl.gov.lk

විගණකවරු

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන්

මහජන බැංකුව

පටුන

දැක්ම හා මෙහෙවර	7
ආයතනයේ කාර්යභාරය	9
පිළිගැන්වීම	11
හැඳින්වීම හා ව්‍යුහය	13
අධ්‍යක්ෂ මණ්ඩලය	13 -14
මෙහෙයුම් කාර්යභාරය	15
2024 විශේෂිත කාර්යයන්	16-17
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	19
2024 වසරේ කාර්යයසාධනය	19-20
වෘත්තීය පුහුණු පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා නව තාක්ෂණය යොදා ගැනීමේ අරමුණින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා ගිවිසුම්ගත වීම	21-22
2025 වසර සඳහා වැඩසටහන් හා ඉලක්ක	23
සාමූහික යහපාලන වාර්තාව	24
සාමූහික සමාජ වගකීම	24
තිරසාර සංවර්ධනය	24
අවදානම් කළමනාකරණ	25
ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය මණ්ඩලය	27-28
කාර්යය මණ්ඩල සංයුතිය	29-31
පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම	33-36
රජයේ ප්‍රතිපාදන ප්‍රතිලාභයන් පුහුණුවන්නන් වෙත ලබා දීම	37
කාර්යය මණ්ඩලයේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම	38-39
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය	40-42
වෘත්තීය පරීක්ෂණ හා ඇගයීම්	43
වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය	44
කර්මාන්ත සබඳතා සහ රැකියාගත කිරීම	45-47
රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන්	48
ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	49
අභියෝග	51
විගණන කමිටු කාර්යසාධනය	53-54
මූල්‍ය ප්‍රකාශන වාර්තාව	55-83
මූල්‍ය විග්‍රහය 2013 2024	85
විගණකාධිපති වාර්තාව	87-95
විගණකාධිපති වාර්තාව සඳහා නිරීක්ෂණ වාර්තාව	96-104

දැක්ම හා මෙහෙවර

දැක්ම

ගෝලීය රැකියා නිපුණත්වය ලබා දීම තුලින් උසස් ජීවන තත්ත්වයක් ඇති කිරීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම ක්‍රියාශීලි සහ නිර්මාණශීලි වෘත්තීය අධ්‍යාපනය පුහුණුව සහ සේවා සපයන්නා බවට පත්වීම

RECORD

ආයතනයේ කාර්යභාරය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනතේ විධිවිධානයන්ට අනුකූලව ආයතනික කාර්යභාරය පහත පරිදි වේ.

01 වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම හා රැකියා ගතවීම සඳහා අවශ්‍ය දක්ෂතා ලබාගත හැකිවන පරිදි තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුවක් සෘජුව හෝ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ නියෝජ්‍ය ආයතනයක් මගින් ලබාදීම.

02 ජාතික වෘත්තීය පරීක්ෂණ, විභාග පැවැත්වීම සහ වෘත්තීය පුහුණුව ලබා ඇති ආධුනිකයන්ට සහතික සහ වෙනත් ප්‍රදාන නිකුත් කිරීම,

03 වෘත්තීය පුහුණුව හා ආයතනික සංවර්ධනයන් උදෙසා වන පර්යේෂණ අධ්‍යයනයන් සිදු කිරීම.

04 වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල නිසි ප්‍රමිති පවත්වාගෙන යාම සඳහා එම මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම.

05 අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා සපයන ලද පහසුකම් සහ උපකරණ වෙනුවෙන් ගාස්තු හෝ වෙනත් අයකිරීම් නියම කිරීම සහ අය කිරීම.

06 අධිකාරියේ කටයුතු සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම, කුලියට ගැනීම හෝ බැහැර කිරීම.

07 අධිකාරියේ කර්තව්‍යය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළුම ගිවිසුම් වලට එළඹීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

08 අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා තෝරා ගනු ලැබූ ආධුනිකයින්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සේවායෝජකයින් සමඟ ගිවිසුම් වලට එළඹීම.

09 අධිකාරියේ ආධුනිකයින්ට වෘත්තීය පුහුණුව ලබා දීමට අදහස් කරනු ලබන සෑම සේවායෝජකයෙකුම එම පුහුණුවට ප්‍රථම ආධුනිකයා සමග ගිවිසුමකට එළඹිය යුතු බවට සහ එම ගිවිසුම අධිකාරිය වෙත ලියාපදිංචි කරන බවට වග බලා ගැනීම.

10 වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශන ලබාදීම.

පිළිගැන්වීම

නියෝජ්‍ය අමාත්‍ය නලීන් හේවගේ මැතිතුමා,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යංශය,
නිපුණතා පියස,
නාරාහේන්පිට,
කොළඹ 05.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි,

වාර්ෂික වාර්තාව -2024
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනතේ 25 වන වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) ක් වගන්තිය ප්‍රකාරව 2024 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙයට,
විශ්වාසී,

විජිත වීරතුංග
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

VTA
VTA

හැඳින්වීම හා ව්‍යුහය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 1995 අගෝස්තු 16 වන දින ස්ථාපිත කරන ලදී. එවකට කම්කරු දෙපාර්තමේන්තුව යටතේ වූ මිනිස්බල අංශය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට පවරා ජීවිතයට හැකියාවක් - හැකියාවට රැකියාවක් යන තේමාව යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීමේ ප්‍රධාන අභිප්‍රාය වූයේ රටේ ග්‍රාමීය තරුණ තරුණියන් වෙත ළඟා වී දේශීය හා ජාත්‍යන්තර වශයෙන් රැකියා අවස්ථා සඳහා යොමු විය හැකි ශිල්පීය හැකියාවන් ලබා දීම වේ.

ව්‍යවස්ථාපිත ආයතනයක් වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වර්තමානයේ පුහුණු ක්ෂේත්‍ර 18 ක් ඔස්සේ දිවයින පුරා ව්‍යාප්තව ඇති පුහුණු මධ්‍යස්ථාන 194 ක් තුලින් වෘත්තීය පුහුණු අවශ්‍යතා සපුරාලන අතර ගෝලීය ශ්‍රම බලකායට නිපුණතා පූර්ණ තරුණ තරුණියන් බිහි කිරීම තුලින් ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් සලසනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

2024 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාලක මණ්ඩලය අවස්ථා 02 කදී පත්විය.

මෙම වර්ෂයේ අවසන් පාලක මණ්ඩලය 2024.09.30 දින පත් වී සිටින ලදී. 2024.12.31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් වී නොතිබුණි.

අධ්‍යක්ෂ මණ්ඩලය (2024.05.27 - 2024.09.30)

එස්. කේ. රාජපක්ෂ මහතා	සභාපති ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
එස්. පී. ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා	උප සභාපති ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
එච්. ඩබ්. කේ. අතාවුදගේ මිය	අතිරේක ලේකම් නිපුණතා සංවර්ධන අංශය
එස්. ඒ. මහින්ද ලාල් ගුණතිලක මහතා	අතිරේක ලේකම් (කර්මාන්ත සංවර්ධන) කර්මාන්ත අමාත්‍යංශය
එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතා	කම්කරු කොමසාරිස් ජනරාල් කම්කරු දෙපාර්තමේන්තුව
ජේ. ඒ. රොෂාන් මහතා	අධ්‍යක්ෂ (යෞවන කටයුතු) ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යංශය
ටී. ඩී. රසිකා ප්‍රබෝධනි මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් අමාත්‍යංශය
ඩබ්. ඒ. සංජීව මහතා	ප්‍රධාන විධායක නිලධාරි සදගිරි ටයර් ඇන්ඩ් බැටරි වර්ක්ස්
එම්. කේ. ඩබ්. ශාන්ත ලාල් ද සිල්වා මහතා	භාණ්ඩාගාරික ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය
විරාජ් හර්ෂණ පෙරේරා මහතා	කළමනාකරණ අධ්‍යක්ෂ රිලයන්ස් කැපිටල් පුද්ගලික සමාගම

අධ්‍යක්ෂ මණ්ඩලය (2024.01.01-2024.04.05)

එයාර් වයිස් මාර්ෂල් ප්‍රසන්න රණසිංහ (විශ්‍රාමික)	සභාපති ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
චතුර ද සිල්වා මහතා	උප සභාපති ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
එච්. කේ. කේ. ඒ. ජයසුන්දර මහතා	කම්කරු කොමසාරිස් ජනරාල් කම්කරු දෙපාර්තමේන්තුව
එච්. ඩබ්. කේ. අතාවුදගේ මිය	අතිරේක ලේකම් නිපුණතා සංවර්ධන අංශය
ටී.ඩී. රසිකා ප්‍රබෝධනි මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් අමාත්‍යංශය
චන්න ප්‍රසාද් සුබසිංහ මහතා	අධ්‍යක්ෂ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය
එස්. ඒ. මහින්ද ලාල් ගුණතිලක මහතා	අතිරේක ලේකම් : කර්මාන්ත සංවර්ධන කර්මාන්ත අමාත්‍යංශය
ජේ. ඒ. ඩී. රොෂාන් මහතා	අධ්‍යක්ෂ (යෞවන කටයුතු) ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යංශය
එස්. ජී. ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා	ව්‍යාපාරික
විරාජ් හර්ෂණ පෙරේරා මහතා	කළමනාකරණ අධ්‍යක්ෂ රිලයන්ස් කැපිටල් පුද්ගලික සමාගම
එස්. කේ. රාජපක්ෂ මහතා	ව්‍යාපාරික
නොයෙල් ජෝෂප් මහතා	කළමනාකරණ අධ්‍යක්ෂ ප්‍රොපිටර් ඔෆ් එන් ජේ කන්සල්ටන්

2024 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08 ක් පවත්වා ඇත.

මෙහෙයුම් කාර්යභාරය

අංශය	කාර්යභාරය
සැලසුම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය	ආයතනික මෙහෙයුම් කාර්යය සඳහා දායකත්වය සපයන අංශයකි. ආයතනික දැක්ම,මෙහෙයුම් සහ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය දිගුකාලීන සහ කෙටිකාලීන සැලසුම් සකස් කිරීම සහ ප්‍රගතිය විශ්ලේෂණය කරමින් නව පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය පියවරයන් සැලසුම් කිරීම හා වෘත්තීය පුහුණුවට අදාල විවිධ පර්යේෂණයන්, සිද්ධි අධ්‍යනයන් සිදු කිරීමද නව ව්‍යාපෘති වාර්තාවන් සකස් කිරීම සහ අධීක්ෂණය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. අංශයට අනුයුක්තව ඇති තොරතුරු පද්ධතීන් (MIS/MS) කළමනාකරණය කිරීම මගින් ආයතනික සංවර්ධනය උදෙසා වන උපායමාර්ගික විශ්ලේෂනයන් කළමනාකරණය සඳහා සැපයීම සිදු කරනු ලබයි.
වෘත්තීය මාර්ගෝපදේශන හා ප්‍රවර්ධන අංශය	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රමුඛ කාර්යයක් වන වෘත්තීය පුහුණුව ලබා දීම උදෙසා දිවයින පුරා ස්ථානගතව සිටින වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් මගින් වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශනය, ආධුනිකයින් බඳවා ගැනීම සිදු කරනු ලබයි. ඒ සඳහා අවශ්‍ය ප්‍රවර්ධන කාර්යයන් ශ්‍රව්‍ය, දෘශ්‍ය හා සමාජ මාධ්‍යයන් ඔස්සේ ප්‍රවර්ධනය කිරීමද මෙම අංශය හරහා සිදු කරයි.
පුහුණු අංශය	ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ මෙහෙයුම් ක්‍රියාවලියේ ප්‍රමුඛතම අංශය වන අතර දිවයින පුරා ස්ථාපිත පුහුණු මධ්‍යස්ථාන මගින් සිදුවන පුහුණු කාර්යභාරය නව්‍යකරණය කරමින් පුහුණු කාර්යය කළමනාකරණය කරනු ලැබේ. වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ඇතුලත් වන ආධුනිකයින් නිපුණතාවයන්ගෙන් සවිබල ගැන්වීම සඳහා වන මඟ පෙන්වීම මෙම අංශය මගින් ඉටු කරනු ලබයි
පරීක්ෂණ සහ ඇගයීම් අංශය	පරීක්ෂණ සහ ඇගයීම් කටයුතු කිරීම පිළිබඳව අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් සකස් කිරීම, අදාල උපදේශකවරුන්/විභාග පරීක්ෂකවරුන් /කාර්ය මණ්ඩලය පුහුණු කරමින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල පවත්වන සියලූ පාඨමාලා සඳහා පෙර ඇගයීම් සහ අවසන් ඇගයීම් සැලසුම් කිරීම, පැවැත්වීම, නියාමනය සහ අධීක්ෂණය කිරීමේ කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලබයි.
සම්පත් කළමනාකරණය හා පාලන අංශය	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවාවන් සදහා අවශ්‍ය භෞතික සහ මානව සම්පත් කළමනාකරණය පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර අධිකාරිය සතු රු.බිලියන 7 ක් පමණ වටිනාකමින් යුත් භෞතික සම්පත් පවත්වාගෙන යමින්ල යටිතල පහසුකම් කළමනාකරණය මෙම අංශය මගින් ඉටු කරයි.වෘත්තීය පුහුණු ක්‍රියාවලියේ එක් ප්‍රධාන පුරුකක් ලෙස ක්‍රියාත්මක වේ
ගිණුම් අංශය	රජයේ පිළිගත් මූල්‍ය ප්‍රතිපත්තීන්ට අනුව වාර්ෂික මූල්‍ය ඇස්තමේන්තු, මූල්‍ය කළමනාකරණය හා මූල්‍යකරණයේ යහපාලනයක් උදෙසා සියලූම අංශයන් වෙත මඟපෙන්වීමක් සිදු කරනු ලබයි
අභ්‍යන්තර විගණන අංශය	ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමට හා ඒ හා වන මෙහෙයුම් කාර්යයට උපදේශාත්මකව නිවැරදි දිශානතියක් පෙන්වීමට ස්වාධීනව ක්‍රියා කරන අංශයකි.එමගින් ආයතනයේ ඵලදායිත්වය වැඩි දියුණු කිරීමට දායකත්වය ලබා දේ.
කර්මාන්ත සබඳතා ඒකකය	මෙම ඒකකය විසින් ආයතනික පුහුණුව අවසන් කරනු ලබන ආධුනිකයින් ඒ ඒ ක්ෂේත්‍රයන්ගේ නිපුණතාවය වඩාත් ඔප මට්ටම් කිරීම හා නවීන තාක්ෂණික භාවිතයන් උදෙසා වැඩිදුර පුහුණු අවශ්‍යතාවයන් වෙත යොමු කරනු ලබයි. ඒ සඳහා කර්මාන්තයන් සමඟ එක්ව ආයතනයේ වැඩිදුර පුහුණුව සඳහා යොමු කිරීම, කර්මාන්ත සංසඳ, රැකියා පොළ සංවිධානය කිරීම සිදු කරනු ලබයි.

2024 විශේෂිත කාර්යයන්

- වෘත්තීය හා ශිල්පීය පුහුණුව සපයන රාජ්‍ය අංශයේ ආයතනයන් අතුරින් 30% කට අධික තරුණ තරුණියන් පිරිසකට වෘත්තීය පුහුණුව සපයන ආයතනය බවට පත් වීම

- ජාතික වෘත්තීය සුදුසුකම් 5 සහ 6 සම්පූර්ණ කල ඩිප්ලෝමාධාරීන් 761 දෙනෙකු සඳහා ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවයක් පැවැත්වීම.

- කොළඹ විශ්ව විද්‍යාලය හා එක්ව විශේෂ අවශ්‍යතා ඇති (ඔටිසම් සහ ඩවුන් සින්ඩ්‍රෝම්) දරුවන්ට තොරතුරු තාක්ෂණ ආහාර හා භෝජනාගාර සේවා පාඨමාලාව ආරම්භ කරමින් ඔවුන් සමාජීය වශයෙන් බලගැන්වීම.

- දේශීය, විදේශීය රැකියා ඉලක්ක කර ගනිමින් තරුණ තරුණියන්ගේ රැකියා විරහිතභාවය අවම කිරීමේ අරමුණින් දේශීය හා විදේශීය ආයතන 147 ක් හා සම්බන්ධ වෙමින් රැකියා වෙළඳපල 6 ක් පැවැත්වීම හා ප්‍රධානතම රැකියා වෙළඳපල ඔරුගොඩවත්ත ජාතික වෘත්තීය පුහුණු ආයතනයේදී 2024.12.10 දින පැවැත්වීම.

- දිවයිනේ ප්‍රමුඛපෙළේ කර්මාන්ත 30 ක් හා එක්ව කර්මාන්ත සංසඳ පැවැත්වීම.

- Association of Public Finance Accountants of Sri Lanka (APFASL) විසින් පිරිනමන රාජ්‍ය අංශය සඳහා වන සම්මානය (ලෝකඩ) 2023 වාර්ෂික වාර්තාව සඳහා හිමිකර ගැනීම.

- කොරියානු රජයේ කොරියා ව්‍යාපෘතිය යටතේ නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතනය සඳහා නව පුහුණු උපකරණ ලබා ගැනීම සහ තෝරා ගත් (විදුලි කාර්මික ශිල්පී, පෑස්සුම් ශිල්පී, මොටර් රථ කාර්මික ශිල්පී) නියමු පාඨමාලා 3 ක් ආරම්භ කර පවත්වාගෙන යාම.මෙම පුහුණුව සාර්ථකව අවසන් කරන පුහුණුලාභීන්ට දේශීය හා විදේශීය රැකියා අවස්ථා සඳහා පහසුවෙන් ලගා වීමේ හැකියාව පවතී.

Motor Control System
Motor Controlling Direct On Circuit

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ 1995 අගෝස්තු මස 16 වන දින ස්ථාපිත කරනු ලැබූ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 2024 වර්ෂයේ දී ද ජාතික වෘත්තීය පුහුණු ආයතන 08 ක්, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22 ක් හා ප්‍රාදේශියව ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 164 කින් සමන්විත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 194 ක මධ්‍යස්ථාන ජාලයක් ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකාවේ තරුණ තරුණයින් හට වෘත්තීය දැනුම, ආකල්ප හා ශිල්පීය හැකියාවන් ලබා දුනි.ඒ සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් 1605 ක් පූර්ණකාලීනවද 315 අර්ධකාලීනවද පවත්වා යෞවන / යෞවනියන් 31247 ක් පුහුණුව සඳහා බඳවා ගනු ලැබීය.

2024 වසරේ කාර්යය සාධනය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලය 2727 කි.ඉන් 67 ක ප්‍රමාණයක් අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් උපදේශන කාර්ය මණ්ඩලය වේ. 2024 වසර ද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අභියෝගාත්මක වසරක් විය.උපදේශක වැටුප ආකර්ශනීය නොවන තත්ත්වය මත විශාල උපදේශකවරුන් පිරිසක් ආයතනය හැර යන පසුබිමක පුහුණු කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට ආයතනය කටයුතු කරනු ලැබීය. සමස්ත උපදේශක හිඟය 763 ක් හා නවීන තාක්ෂණික පුහුණු උපකරණ වැනි සම්පත් හිඟයද සහිතව 2024 වසර තුළ රු.මිලියන 723 ක ආදායමක් ඉපයීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට හැකි විය.මෙය පෙර වසරට වඩා රු.මිලියන 221 ක ඉහළ යාමකි.

2024 වර්ෂය තුළ පහත කාර්යය සාධනයන්ද අත්කර ගැනීමට සමත් විය.

1. 2024 වර්ෂයේ දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 194 ක දී පූර්ණකාලීනව හා අර්ධකාලීනව වෘත්තීය පුහුණුව සඳහා තරුණ තරුණියන් පිළිවෙලින් 24780 ක් හා 6467 ක් වශයෙන් 31247 ක් බඳවා ගැනීමට කටයුතු කිරීම.එය උපදේශක හිඟය මත ඉලක්කගත සංඛ්‍යාවෙන් 75 ක් සපුරා ගැනීමට හැකිවීම.
2. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 28,258 කුත් වෘත්තීය පුහුණු අධිකාරියේ සහතික (VTA Certificate) 3,571 කුත්, පෙර දැනුම ඇගයීම (RPL) යටතේ සහතික 3,600 කුත් වශයෙන් සහතික 35,429 ක් නිකුත් කිරීම.
3. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ රැකියා සඳහා අත්‍යාවශ්‍ය වන නව මොඩියුල 3 ක් විෂයමාලාවට එකතු කිරීම.
4. වෘත්තීය පුහුණු අධිකාරියේ සේවාවන් සමාජගත කිරීම හා වෘත්තීය පුහුණු සන්නාමය ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් ප්‍රදර්ශන සඳහා සහභාගි වීම. උදා: EDE. E.po-2024 Career Fair, Skill Force හා ජයගමු ශ්‍රී ලංකා. -BAN-2024
5. වෘත්තීය පුහුණුව කෙරෙහි නැඹුරු කිරීමේ හා දැනුවත් කිරීමේ අරමුණින් අ.පො.ස.(සා.පෙළ) හා උසස් පෙළ සිසුන් ඉලක්ක කරමින් කොළඹ හා තදාසන්න පාසල් 12 ක STEAM CLUB පිහිටුවා 2024.04.02 නියමු ව්‍යාපෘතියක් ලෙස එකම දිනයක අනුග්‍රාහක ආයතන 12 සම්බන්ධ කර ගනිමින් තෝරා ගත් පාසල් 12 තුල නිපුණතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. රාජ්‍ය හා පෞද්ගලික සහයෝගීත්වය (PPL)කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයතනයන් හා එක්ව විවිධ වෘත්තීන් සඳහා වන විශේෂිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.මේ මගින් නව තාක්ෂණික අත්දැකීම් ලබා දීම හරහා නිපුණතාවයන් ඔප් නැංවීම. Lanka Tiles ,Viana Cosmetics,Nature's Beauty Creations Ltd,Swisstek Aluminium Ltd
7. පුහුණු පාඨමාලාවන්ගේ, විෂයමාලා පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීම, වැඩිදුර පුහුණු අවස්ථා හා රැකියා උදාකර ගැනීම මෙන්ම පුහුණුලාභියා හා කර්මාන්තයන් අතර පරතරය අවම කිරීම වැනි අරමුණු පෙර දැරිකර ගනිමින් කර්මාන්ත සංසඳ පැවැත්වේ. ඒ අනුව 2024 වසර තුළ විදුලි, විද්‍යුත්, ශීතකරණ හා වායුසමීකරණ, හෝටල් හා ආගන්තුක සත්කාර හා තොරතුරු සන්නිවේදන ක්ෂේත්‍රයන් සඳහා දිවයිනේ ප්‍රමුඛපෙළේ කර්මාන්තකරුවන් සමඟ වැඩමුළු 03 ක් සංවිධානය කෙරිණි.
8. ආධුනිකයින්ට පහසුකම් සැලසීම වෙනුවෙන් 2024 වර්ෂයේ රු.මිලි. 25 ක ප්‍රාග්ධන ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් දිස්ත්‍රික් /ජාතික වෘත්තීය පුහුණු

මධ්‍යස්ථාන ඇතුළත්ව මධ්‍යස්ථාන 08 ක් ද රු.මිලි.106 ක අමාත්‍යංශ ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 04 ක් ද සංවර්ධනය කිරීම.

9. කාන්තා කාර්යංශය සමඟ සම්බන්ධව කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සිටින වයස අවු 25 ට අඩු ආදායම්ලාභී තරුණියන් තෝරා ගනිමින් 80 දෙනෙකු දැනුවත් කර ඔවුනට වෘත්තීය විභවයන් හඳුන්වා දෙමින් කෙටිකාලීන පාඨමාලා (NVQ 3 මට්ටම) ආරම්භ කිරීමෙන් පසු සූපවේදි, බේකරි, රූපලාවන්‍ය, වැඩිහිටි සුරැකුම් සහ ඇඳුම් මැසීම පාඨමාලා අවසන් කරන ලද තරුණියන් හට සහතිකපත් ලබා දීම.

10. ආයතනික මානව සම්පත දැනුම, කුසලතා, ආකල්ප මගින් සංවර්ධනය කිරීමේ අරමුණින් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙලින් දේශීයව 877 ක් සහ 449 ක් ද 12 දෙනෙකු සඳහා විදේශගත පුහුණුව ද ලබා දීමට කටයුතු කර ඇත.

11. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වන Autism, Spectrum දරුවන් සඳහා වන ICT Technician දෙවන කණ්ඩායම පුහුණුව ආරම්භ කිරීම හා Down Syndrome දරුවන් සඳහා ආහාර සහ භෝජනාගාර සේවා පාඨමාලාව (Food and Beverage Associate) ගල්කිස්ස Mount Lavinia හෝටලයේ වැඩිදුර පුහුණුව ලබා දීම තුළින් අවසන් කිරීම. කථන ආබාධ සහිත දරුවන් සඳහා Graphic Designer පාඨමාලාව ද වසර 10 කට වැඩි වකවානුවක සිට සාර්ථකව පවත්වා ගෙන යනු ලැබේ.

12. විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට දිවයින පුරා පිහිටි මධ්‍යස්ථාන මගින් පුහුණුව ලබා දීමේ අරමුණින් ළමා මානසික සෞඛ්‍ය පිළිබඳ මහාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය ද රැගෙන Food and Beverage Associate and ICT Technician උපදේශකවරුන් 37 ක් සඳහා කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

13. Japan International Corporation System (JICS) ආධාර යටතේ යාපනය කිලිනොච්චිය මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්කයන්හි පුහුණු මධ්‍යස්ථාන 06 ක ක්‍රියාත්මක ඇඟලුම් කර්මාන්ත පාඨමාලා සඳහා ජපාන යෙන් මිලියන 363 ක් වටිනා උපකරණ ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම

14. GIZ ව්‍යාපෘති ආධාර යටතේ,

- මාතර - අකුරැස්ස වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ වැඩිහිටි සත්කාරක (Elder Care) පාඨමාලාව ආරම්භ කිරීමට අදාල උපකරණ හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මිලියන 10.5 ක ආධාර ලබා දීම.
- තෝරා ගත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 5 කට හරිත සංකල්පය හඳුන්වා දීමට අදාල පරිසර ඇගයීම් සඳහා වන මෙවලම් හඳුන්වා දීමට මූලික පියවර ගැනීම.

15. දේශීය, විදේශීය රැකියා ඉලක්ක කර ගනිමින් තරුණ තරුණියන්ගේ රැකියා විරහිතභාවය අවම කිරීමේ අරමුණින් දේශීය හා විදේශීය ආයතන 147 ක් හා සම්බන්ධ වෙමින් රැකියා වෙළඳපල 6 ක් පැවැත්වීම.

16. Barista ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව පවත්වාගෙන ගිය Barista පාඨමාලාව NVQ Level 3 පාඨමාලා ලෙස සංවර්ධනය කිරීම.

17. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ඇලූමිනියම් ක්ෂේත්‍රයේ සහ දැව තාක්ෂණ ක්ෂේත්‍රයේ පාඨමාලාවන්හි ඉගැන්වීම් කටයුතු සිදු කරන උපදේශකවරුන් වෙත එම ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් වන IDEA Industries Limited ආයතනය මගින් වැඩිදුර පුහුණුව ලබා දීම.

වෘත්තීය පුහුණු පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා නව තාක්ෂණය යොදාගැනීමේ අරමුණින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා ගිවිසුම්ගත වීම.

- **කර්මාන්ත අමාත්‍යංශය - විද්‍යාතා ඒකකය :-** ජලනල විදුලි හා රූපලාවන්‍ය ක්ෂේත්‍රයන් වල නිපුණ ශ්‍රමිකයින් බිහි කිරීම සඳහා වැඩසටහන් 19 ක් මගින් පුහුණුවන්නන් 357 ක් පුහුණු කිරීම.

- Insight Interior EDMUN (IIEM) :- Interior Designing ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු අදියර ලෙස පුහුණුවන්නන් 15 දෙනෙකු පුහුණු කිරීම.

- ANI ARTS Academics Lanka :- සමාජ සත්කාරක වැඩසටහනක් ලෙස තලල්ල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය තුල අඩු ආදායම්ලාභී පුහුණුවන්නන් 365 කගේ කුසලතා සංවර්ධනය සඳහා මූල්‍ය ආධාර ලබා දීම.

- Ministry of Women, Child Affairs and Social Empowerment:- අවු.18 - 30 ත් අතර ඉලක්කගත කාන්තාවන් 80 ක් සඳහා Bakery, Cookery and Beauty පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කිරීම.

- South Asia Gateway Terminals (Pvt) Ltd :- වරාය බහාලුම් පර්යන්ත මෙහෙයුම් නැව් වල නඩත්තු කාර්මික ශිල්පීය කුසලතා සංවර්ධනය කිරීම සඳහා පුහුණුවන්නන් 17 දෙනෙකු පුහුණු කිරීම.

- Oracle Academy :- ලොව පිලිගත් Oracle Academy විෂයමාලාව ICT Level 5, Level 4 සහ Software Developer පාඨමාලා සඳහා ඇතුලත් කර ක්‍රියාත්මක කිරීම හා Oracle සහතිකපත්‍රය ලබා දීම.

- NEXTGEN Skills Development & Placement (Pvt) Ltd :- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විදේශ රැකියා සඳහා නිපුණතාවය ලබා දීම සඳහා අත්තිඩිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල පාඨමාලා 3 ක් ආරම්භ කිරීම. සිසුන් 47 ක් පුහුණු වීම හා ඉන් 8 දෙනෙකු විදේශ රැකියා සඳහා යොමු වීම.

- Scope Global (Pvt) Ltd :- විශේෂ අවශ්‍යතා ඇති ශිෂ්‍යයන්ගේ කුසලතා සංවර්ධනය සඳහා අධ්‍යාපන අමාත්‍යංශයට අයත් වෙනිවැල්කොළ මධ්‍යස්ථානය හරහා පාසල් පද්ධතිය තුළ අන්තර්ගත අධ්‍යාපනය තවදුරටත් ශක්තිමත් කිරීම.

- Euro Cosmetics :- රූපලාවන්‍ය පාඨමාලාවන් සඳහා අවශ්‍ය උසස් තත්ත්වයේ පුහුණු ද්‍රව්‍ය අඛණ්ඩව සැපයීම.

- St.Anthonys Industries group :- ජලනල හා විදුලි හා වඩු කාර්මික ක්ෂේත්‍ර වල නිපුණ ශිල්පීන් 1000 දෙනෙකු බිහි කිරීම.

- Idea Industries :- ඇලුමිනියම් පිරිසැකසුම් හා අත්කම් ක්ෂේත්‍රයන්හි නියැලෙන ආධුනිකයින්ගේ ශිල්පීය කුසලතා වැඩිදියුණු කිරීම.

- පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් හැර ගිය ළමුන් සඳහා ICT පාඨමාලා ආරම්භ කිරීම.

- MOSVOLD Martinos :- පාඨමාලා හදාරන ආධුනිකයින්ගෙන් මූල්‍ය අපහසුතා ඇති සිසුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම.

අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්

Insight Interior EDMUN ආයතනය සමඟ ගිවිසුම්ගත වීම

NEXTGEN Skills Development & Placement (Pvt) Ltd
ආයතනය සමඟ ගිවිසුම්ගත වීම

විදාතා ආයතනය සමඟ ගිවිසුම්ගත වීම

South Asia Gateway Terminals (Pvt) ආයතනය සමඟ ගිවිසුම්ගත වීම

2025 වසර සඳහා වැඩසටහන් හා ඉලක්ක

නූතනයේ ශ්‍රී ලංකාව තුළ තරුණ ශ්‍රමය ඵලදායීව උපයෝජනය නොවන ප්‍රවණතාවයක් පවතී.බහුතරයක් තරුණ තරුණියන්ගේ වටිනා ශ්‍රමය දළ ජාතික නිෂ්පාදිතයට පූර්ණ දායකත්වයක් නොදෙන අතර තරුණ තරුණියන් සුදුකරපටි රැකියා (White Collar Job) අපේක්ෂාවෙන් දීර්ඝ කාලයක් රැකියා විරහිත තත්ත්වයකට පත් ව ඇත.

එහෙත් නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපනය තුළින් විශාල මෙහෙවරක් මේ වෙනුවෙන් සිදු කල හැකිය. ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම තුලින් වෘත්තීය අධ්‍යාපනය සඳහා නැඹුරු කිරීමේ වැඩපිළිවෙලක් පාසල් අධ්‍යාපනය තුලින්ම අරඹා මේ සඳහා වැඩි ප්‍රතිපාදන වෙන් කිරීම තුළින් වෘත්තීය පුහුණුව ඉහළ නැංවීමට කටයුතු කල යුතු කාලය එළඹ ඇත.

රට තුළ සදාචාරාත්මක, පාරිසරික හා සමාජමය වෙනසක් ඇති කිරීමේ අරමුණින් රජය විසින් සැලසුම්ගත කර ඇති Clean Sri Lanka ජාතික වැඩසටහන සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අනන්‍ය වූ ක්‍රියාත්මක සැලැස්මක් මගින් දායක වීමට කටයුතු කරනු ඇත.

රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණුව සපයන ප්‍රමුඛතම ආයතනය වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට විශාල සමාජ මෙහෙවරක් 2025 වසර තුළ ඉටු කිරීමට සිදුවනු ඇත.ගෝලීය රැකියා වෙළෙඳපල තුළ නිපුණ ශිල්පීය දැනුමින් පිරිපුන් ශ්‍රමිකයින් බිහිකිරීම උදෙසා විවිධ ක්‍රමෝපායන් ඉදිරි වසර තුළ ක්‍රියාත්මක කිරීමට අවැසි පසුබිමක් සකස් කරනු ඇත.

1. වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර 18 ක් යටතේ ජාතික ශ්‍රම බලකායට උචිත කුසලතා පූර්ණ තරුණ පරපුරක් දායාද කිරීමේ අරමුණින් දිවයින පුරා ඉලක්කගත වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 2185 ක් පැවැත්වීම තුළින් පිලිවෙලින් පූර්ණකාලීනව හා අර්ධකාලීනව 28,530 ක් හා 9,590 ක් ලෙස ආධුනිකයින් 38,120 දෙනෙකු පුහුණු කිරීම.ඊට අමතරව නම්‍යශීලි ඉගෙනුම් හා මිශ්‍ර ක්‍රමවේද අනුගමනය කරමින් තරුණ ඉල්ලුමට සරිලන කෙටිකාලීන පුහුණු වැඩසටහන් දියත් කිරීමට සැලසුම් කෙරේ.
2. විධිමත් ඇගයීම් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ඇගයීම් 25,000 ක් සහ වෘත්තීය පුහුණු සහතිකපත් 10,000 ක් ද RPL 6000 ක් වශයෙන් ඇගයීම් පැවැත්වීමට කටයුතු කිරීම.
3. සංවර්ධන ප්‍රමුඛතා සහ වෙළඳපල අවශ්‍යතා සමපාත වන විවිධ ගුණාත්මක පාඨමාලා හා ආදායම් උත්පාදක මාර්ගයන් හඳුන්වා දෙමින් 2025 වර්ෂයේ රු.මිලි 500 ක ආදායම් උත්පාදක ඉලක්කයක් කරා ගමන් කිරීම.
4. පුහුණු මධ්‍යස්ථානයන්හි ධාරිතාවය වර්ධනය සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම උදෙසා රු.මිලි. 375 ක් ඇස්තමේන්තුගත කිරීම
5. වෘත්තීය පුහුණුව හා කර්මාන්තගත අවශ්‍යතාවයන් සමපාතික කිරීම උදෙසා කර්මාන්තයන් හා සහයෝගිත්වය වර්ධනය කිරීමේ කර්මාන්ත සංසඳ 9 ක් පැවැත්වීම හා එමගින් රැකියා වෙළඳපල 20 ක් දිවයින පුරා පැවැත්වීම.
6. විවිධ ක්ෂේත්‍රයන්හි රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනයන් හා ගිවිසුම්ගතව වෘත්තීය පුහුණු ප්‍රවර්ධනය උදෙසා Skill gap filling Programmes හඳුන්වා දීමට නිරන්තරව කටයුතු කිරීම.
   - Certis Lanka Home Nursing and Swift Care (Pvt) Ltd

     NVQ Level 3 යටතේ ගෘහස්ථ හෙද නිලධාරියෙකු ලෙස අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීම තුළින් 500 දෙනෙකු පුහුණු කිරීම.
   - Certis Lanka security solutions

     NVQ Level 3 යටතේ ආරක්ෂක නිලධාරියෙකුට අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීම තුළින් 1000 දෙනෙකු පුහුණු කිරීම.
   - Department of Probation and child care

     කැප්පෙටිපොල විශාඛා පුහුණු මධ්‍යස්ථානය හා සහතිකලත් පුහුණු පාසල සඳහා දැව ශිල්පී, විදුලි, පේස්ට්‍රි සහ බේකරි, ටේලර්, කොණ්ඩා මෝස්තර, රූපලාවන්‍ය ශිල්පී යන පාඨමාලා පවත්වා කුසලතා සංවර්ධනය කිරීම.
   - Skills for Inclusive Growth (S4IG)

     විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට වෘත්තීය විෂය ධාරාව යටතේ වෙනිවැල්කොළ විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනයේ වෘත්තීය පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කර සිසුන් හට පුහුණුව ලබා දීම.
7. GIZ ව්‍යාපෘති ආධාර යටතේ පහත පාඨමාලා ආරම්භ කිරීමට ද සැලසුම් කර ඇත.
   - Solar PV System - බුලත්සිංහල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය (කලුතර)
   - Caregiver - වේයන්ගොඩ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය (ගම්පහ)

     - කයිතඩි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය (යාපනය)
   - Graphic Designing - නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනය (කොළඹ)

ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව වෙනුවෙන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා වූ ඉලක්කගත අරමුණු ඇතුළත් උපායමාර්ගික සැලැස්මට අනුගත වීමෙන් වඩාත් ඵලදායි සමාජ මෙහෙවරක් උදෙසා කඩිනම් සැලසුම් සකස් කිරීම. ඒ තුළින් හඳුනා ගන්නා වැඩසටහන් හා ඉලක්ක කරා යාමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය උත්සුක වනු ඇත.

විජිත වීරතුංග
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

සාමූහික යහපාලන වාර්තාව

1995 අංක 12 දරණ වෘත්තීය පුහුණු අධිකාරී පනතින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මේ වන විට දිවයින පුරා විහිදී පැතිරී ගිය ශාඛා ජාලයකින් සමන්විත වූ ආයතනයක් බවට පත්ව ඇත.

ආයතනය සතුව ඇති මනා සංවිධාන ව්‍යුහය තුලින් ආයතනික පරමාර්ථයන්ට ප්‍රමුඛස්ථානය දෙමින් වඩාත් විනිවිදභාවයෙන් යුත් ප්‍රතිපත්තීන් අනුගමනය කර රටක ජීවනාලිය වන තරුණ පරපුර ජයග්‍රාහී ජීවන මංපෙත් කරා මෙහෙයවීමට අවැසි ශක්තීන් ඔප මට්ටම් කිරීමට සාමූහිකව ක්‍රියාත්මක වනු ඇත.

සාමූහික සමාජ වගකීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විවිධ මට්ටමින් පාසල් අධ්‍යාපනය අවසන් කරනු ලැබූ තරුණ තරුණියන් දහස් ගණනක් වෘත්තීය අධ්‍යාපනයට යොමු කරමින් ඔවුනට රැකියා සුරක්ෂිතභාවය ඇති කර ගැනීමට මංපෙත් සලසන ආයතනයකි.මේ සඳහා විවිධ උපාය උපක්‍රමික වැඩසටහන් ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ සඳහා ඒ ඒ දිස්ත්‍රික් මට්ටමින් සන්නද්ධ වූ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් වටා කාර්යක්ෂම හා ඵලදායි ලෙස සේවයට යොදවා ඇත. විශේෂයෙන් තරුණ තරුණියන්ගේ වෘත්තීය ලැදියාවන් හඳුනා ගැනීමට කටයුතු කරමින් සුදුසු පාඨමාලාවන් වෙත ඔවුන් යොමු කිරීමට මාර්ගෝපදේශන ලබා දීමේ සුවිශේෂී වැඩපිළිවෙලක් ආයතනය මනා වගකීමකින් ඉටු කරනු ලබයි.

මානව දයාව පාරිසරික වගකීම් හා සදාචාරාත්මක ඉගෙනුම් පරිසරයක ආකෘතියක් බවට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පත් වෙනු ඇත.

තිරසර සංවර්ධනය

වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලෙන විවිධ ආයතන අතරින් ඉතාමත් ශක්තිමත්ව සිය මෙහෙවර දිවයින පුරා ප්‍රචලිතව කටයුතු කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පත්ව ඇත.ඒ සඳහා කැප වූ දක්ෂ කාර්යය මණ්ඩලයකින් හා මූල්‍ය ශක්තිමත්භාවයකින් කටයුතු කරනු ලැබේ.

ඒ අනුව හෙට දින රට මුහුණ දී ඇති අර්බුදයන්ට විසඳුම් සෙවීම සඳහා විවිධ ක්ෂේත්‍ර යටතේ වෘත්තීය අධ්‍යාපනය සාර්ථකව නිම කල තරුණ තරුණියන් පෙළ ගැසෙනු ඇත. ගෝලීය රැකියා වෙළඳපලට යොමු කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණ වාර්තාව

1. ආර්ථික අවපාතය සහ ජීවන වියදම් ඉහළ යාම හේතුවෙන් ප්‍රමාණවත් නොවන පුහුණු උපකරණ සහ යල්පැන ගිය පුහුණු උපකරණ නිසා ලබා දෙන පුහුණුවේ ගුණාත්මකභාවය පිළිබඳ අවදානම.

අවදානම අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

- පුහුණු උපකරණ නියමිත කාලයට නියමිත පරිදි ලබා දීමට කටයුතු කිරීම.
- පාඨමාලාවන්හි ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පුහුණු උපකරණ යාවත්කාලීන කිරීම.
- කර්මාන්ත සබඳතා ඒකකය හරහා ආධුනිකයින් වැඩිදුර පුහුණුවට යොමු කිරීම තුළින් නවීන පුහුණු උපකරණ භාවිතයට ඉඩ සැලසීම.

2. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වලට අනුගත වීම නිසා උපදේශකවරුන් බඳවා ගැනීමේ සහ රඳවා ගැනීමේ අවදානම.

අවදානම අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

- උපදේශකවරුන් ඇගයීම් ක්‍රමවේද හඳුන්වා දීම.
- සුදුසුකම් සහිත බාහිර උපදේශකවරු යොදවා ගැනීම.
- ආයතනය හැර යන උපදේශකවරුන් රඳවා ගැනීමට ආකර්ශනීය වැටුප් තලයන් සකස් කර ගැනීමට රේඛීය අමාත්‍යංශය හරහා කටයුතු කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.

3. මානව සම්පත නවීන තාක්ෂණය හා බද්ධ කිරීමට ඇති අවස්ථාවන් අඩුවීම මත සමගාමී තරගකාරී ආයතනය සමඟ කටයුතු කිරීමේ අවදානම.

අවදානම අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

- සේවක කණ්ඩායම් සඳහා විවිධ අයුරින් දේශීය හා විදේශීය පුහුණුව ලබා දීම.
- උපදේශකවරුන් සඳහා නව තාක්ෂණික පුහුණු ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- කර්මාන්තයන් හා එක්ව කර්මාන්ත නිරාවරණ (Industrial Exposure) වැඩසටහන් හඳුන්වා දීම.

4. රජයේ ප්‍රතිපත්තියක් ලෙස ආයතන වලට ලබා දෙන මූල්‍ය සම්පත් අඩු වීම නිසා ආයතනික යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ අවදානම.

අවදානම අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

- වියදම් අවම කිරීම සඳහා විවිධ සැලසුම් සකස් කිරීම.
- උපායමාර්ගික ව්‍යාපාර ඒකක තුළින් රාජ්‍ය මුදල් මත රැඳී සිටීම අවම කිරීම.
- ආයතනික මට්ටමින් විවිධ ආදායම් උත්පාදන ක්‍රියාවලීන් නිර්මාණය කිරීම.
- මහජන අරමුදල් මත යැපීම අඩු කිරීම සඳහා කර්මාන්ත අනුග්‍රහකයන් සමඟ හවුල් වීම තුළින් ගුණාත්මක පුහුණුවක් ලබා දීම.

5. මූල්‍ය සම්පත් හිඟකම නිසා පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.

අවදානම අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

- කර්මාන්ත සංසද, රැකියා පොළ වැනි වැඩසටහන් තුළින් පුහුණුවන්නන්ගේ ඉදිරි අභිවෘද්ධියට කටයුතු කිරීම.
- සමාජ මාධ්‍ය තුළින් විවිධ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (VTV Youtube නාලිකාව)
- ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපයෝගී කරගෙන විවිධ මාධ්‍ය වැඩසටහන් තුළින් දැනුවත් කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් මඟින් පාසල් සිසුන්, පාසල් හැර යන්නන්, දෙමාපියන් ,ගුරුවරුන් සහ විවිධ ආයතන දැනුවත් කිරීම.

ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය මණ්ඩලය

සභාපති

සමන්ති සේනානායක මිය	
අතිරේක ලේකම් (වෘත්තීය පුහුණු)	2024.10.04 දින සිට (වැඩ බැලීම)
එස් කේ රාජපක්ෂ මහතා	2024.05.27 දින සිට 2024.09.30 දින දක්වා
එයාර් වයිස් මාර්ෂල් ප්‍රසන්න රණසිංහ (විශ්‍රාමික)	2023.03.09 දින සිට 2024.04.05 දින දක්වා

උප සභාපති

එස් .ජී. ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා	2024.02.15 දින සිට 2024.09.30 දින දක්වා
චතුර ද සිල්වා මහතා	2023.03.17 දින සිට 2024 ජනවාරි මස දක්වා

අධ්‍යක්ෂ ජනරාල්

මේජර් ජනරාල් ප්‍රියන්ත වීරසිංහ (විශ්‍රාමික)	2024.10.30 දින සිට මේ දක්වා

අධ්‍යක්ෂවරු

එස්.එම්. එදිරිසිංහ මිය	අධ්‍යක්ෂ (පුහුණු)
ජී.වී.පී.නිරෝෂන පෙරේරා මහතා	අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) 2024.05.10 දින සිට තනතුරේ වැඩ බැලීම අධ්‍යක්ෂ (පරීක්ෂණ හා ඇගයීම් 2024.05.09 දක්වා වැඩ බැලීම)
ජේ. ඒ.ඩී.එස්.නිශාමනී මිය	2019.12.19 දින සිට අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ වැඩ බැලීම.
ජී.එච්.පී.දමයන්ති මිය	අධ්‍යක්ෂ (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන) 2022.05.26 දින සිට තනතුරේ රාජකාරි ඉටු කිරීම.
ඩී. ඒ .එස් .අතුකෝරළ මහතා	අධ්‍යක්ෂ (පරීක්ෂණ හා ඇගයීම්) 2024.05.10 දින සිට තනතුරේ වැඩ බැලීම.
ඒ.එම්.ටී.එස්.ආටිගල මහතා	අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) 2024.05.02 දින දක්වා තනතුරේ රාජකාරි ඉටු කිරීම.
ඊ.ඒ.ඩී.එස් සේනාරත්න මහතා	අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන රැකියාගත කිරීම් හා ප්‍රවර්ධන) 2024.01.10 දින සිට 2024.04.10 දින දක්වා තනතුරේ රාජකාරි ඉටු කිරීම.2024.04.11 දින සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
සී. ජේ විදානපතිරණ මහතා	අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන, රැකියාගත කිරීම් හා ප්‍රවර්ධන) 2024.05.13 දින සිට තනතුරේ රාජකාරි ඉටු කිරීම.
එල්.එන්.ජී.එස්. කුමාර මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක 2024.10.26 දින සිට රාජකාරි ඉටු කිරීම.

නියෝජ්‍ය අධ්‍යක්ෂවරු

1. ඒ. එම්. ටී. එස්. ආටිගල මහතා
2. වී. කනගසුන්දරම් මහතා
3. ටී. විනෝද්රාජා මහතා
4. පී. එන්. අබේසිංහ මහතා
5. එච්. ඒ. පී. ගුණවර්ධන මහතා
6. ආර්. සුනිල් මහතා (2024.08.06 දින විශ්‍රාම ගන්නා ලදි)
7. එම්. කේ. බී. ජයතිලක මහතා
8. වී. ජී. නිමල්සිරි මහතා
9. එස්. මැද්දෙගොඩ මහතා
10. එම්. බී. නලීම් මහතා
11. ආර්. පතිරගේ මිය
12. ඒ. ඒ. ජබීර් මහතා
13. කේ. ඩී. එන්. ද සිල්වා මහතා
14. පී. ජේ. ජයවර්ධන මිය
15. ඩබ්. එම්. ඒ. එස්. එල්. විජේනායක මිය
16. කේ. නිරංජන් මහතා
17. ආර්. මයුරතන් මහතා
18. ඒ. ඒ. ඩී. ටී. ශාන්ත මහතා
19. ටී. වී. ඩබ්. දේවප්‍රිය මහතා
20. ආර්. ඩී. ප්‍රදීපිකා මිය
21. යූ. පී. ජේ. ප්‍රියදර්ශන මහතා

සහකාර අධ්‍යක්ෂවරු

1. ඒ. ඒ. ඩබ්. පී. ආර්. ආර්. බණ්ඩාර මහතා (ශ්‍රී ලංකා නාවික හමුදාවට තාවකාලිකව නිදහස් කර ඇත)
2. පී. ජී. ප්‍රසන්න මහතා
3. එච්. එදිරිසිංහ මිය
4. ඊ. ජේ. විජේතුංග මහතා
5. ඩබ්. කේ. සුමිත් වසන්ත මහතා
6. ආර්. අහිලන් මහතා
7. තිළිණ රණසිංහ මහතා
8. ජී. ඩී. ශ්‍යාමලී මිය
9. සී. ඩී. සමරනායක මහතා
10. සී. යූ. එම්. කොඩිතුවක්කු මිය
11. සුනිල් අබේසිංහ මහතා
12. ජී. කේ. ඩී. සී. කුමාර මහතා
13. එස්. එම්. ජේ. සුරේන්ද්‍ර මහතා
14. එස්. එම්. එම්. කේ. සියමුදලි මිය
15. එන්. කේ. අඹගහවත්ත මිය
16. ඩී.සී. ඕ. විතාන මිය
17. ඒ. ඩී. එස්. සමරසිංහ මහතා
18. ඒ. පී. ජගත් නිශාන්ත මහතා
19. එල්. පී. කේ. ඩබ්. වැලිවත්ත මහතා
20. ඩී. එම්. යහම්පත් මහතා
21. කේ. පී. ඩී. පී. සිරිසේන මහතා
22. එච්. එල්. සිසිර මහතා
23. එන්. ඒ. ඒ. ඩී. නාගහවත්ත මහතා
24. එම් එම් එන් බී මධුරසිංහ මහතා
25. එන්. ඩී. ඩී. එදිරිසිංහ මෙනවිය (2024.02.29 දින සිට සේවයෙන් ඉල්ලා අස් වී ඇත)
26. කේ. එස්. ජී. එස්. ගුණසේකර මහතා
27. එම්. ඩී. ඒ. එම්. අමරසිංහ මිය
28. ටී. එම්. ඒ. තෙන්නකෝන් මහතා
29. අයි. යූ. වික්‍රමනායක මිය
30. එච්. ඒ. ඩී. ආර්. ජයරත්න මහතා
31. එච්. ඩබ්. ආර්. එස්. ජයවර්ධන මහතා
32. ඒ. කේ. ජයවර්ධන මිය
33. එන්. ජී. ඩී. අයි. ගුණරත්න මහතා
34. කේ ඩබ් රංජිත් ලාල් මහතා
35. එස්. එම්. එස්. බී. සමරකෝන් මහතා
36. එස්. ඒ. ඒ. එස්. අතුකෝරල මහතා
37. කේ. ජී. භාතිය අමරනාථ මහතා
38. අයි. එම්. එන්. දිසානායක මහතා
39. බී. ජී. ඩී. කේ. කාරියවසම් මිය
40. කේ. කේ. සෝගීස්මන් මහතා
41. පී. එන්. රණවීර මහතා
42. කේ. අභිෂාදනා මිය

නීති නිලධාරී

ඩී එ එස් ආලෝකා ද සිල්වා මිය

සහකාර අධ්‍යක්ෂවරු (රාජකාරි ආවරණ)

1. ඒ. එම්. පී. අධිකාරි මහතා
2. එච්. එම්. කේ. සී. බණ්ඩාර මහතා
3. එච්. එම්. එස්. ජයතිලක මහතා
4. යූ. ජී. සී. සම්පත් මහතා
5. ඊ. එම්. එස්. කේ. ඊ. මූණමලේ මිය
6. එල්. පී. නිලූකා දිල්මිණි මිය
7. ඩී. ඩී. එන්. කේ. නානායක්කාර මිය
8. එම්. ඩී. ඒ. නිලන්ති මිය
9. ටී. පී. අමරසිංහ මහතා

කාර්යය මණ්ඩල සංයුතිය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව අනුමත කාර්ය මණ්ඩලය 2727 කි.

2024.12.31 දිනට ඒ ඒ තනතුරු මට්ටමින් 1515 දෙනෙකු සේවයේ යෙදිනි.

	තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	වසර අවසානයවන විට කාර්යය මණ්ඩලය	වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය	සේවා කාණ්ඩය
1	අධ්‍යක්ෂ ජනරාල්	1	1	-	HM 2-1
2	අධ්‍යක්ෂ	6	1	5	HM 1-1
3	ප්‍රධාන අභ්‍යන්තර විගණක	1	-	1	
4	විදුහල්පති	1	-	1	MM 1-3
5	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	85	64	21	MM 1-1
6	සහකාර අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන	1	1	-	
7	සහකාර අධ්‍යක්ෂ - අධ්‍යයන	3	-	3	
8	සහකාර අධ්‍යක්ෂ - කාර්මික	1	-	1	
9	සහකාර ලේඛකාධිකාරී	1	-	1	
10	නීති නිළධාරී	1	1	-	
11	අභ්‍යන්තර විගණක	1	-	1	
12	ඉංජිනේරු	1	-	1	
13	පරිපාලන නිළධාරී	3	2	1	JM 1-1
14	පරීක්ෂණ හා ඇගයීම් නිළධාරී	13	6	7	
15	විමර්ශන නිළධාරී	1	1	-	
16	ප්‍රවාහන නිළධාරී	1	-	1	
17	සැපයුම් නිළධාරී	1	1	-	
18	මුද්‍රණ නිළධාරී	1	-	1	
19	අභ්‍යන්තර විගණන නිළධාරී	3	3	-	
20	පද්ධති විශ්ලේෂක	1	-	1	
21	සුභසාධක නිළධාරී	1	1	-	
22	ගිණුම් නිළධාරී	33	24	9	
23	ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිළධාරී	10	9	1	
24	පුහුණු නිළධාරී	98	43	55	
25	පර්යේෂණ නිළධාරී	2	1	1	
26	සැළසුම් නිළධාරී	2	1	1	
27	සභාපති සඳහා වූ පෞද්ගලික සහකාර	1	-	1	
28	පෞද්ගලික සහකාර*	7	4	-	
29	භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)	1	-	1	MA 5-2
30	භාෂා පරිවර්තක (සිංහල/දෙමළ)	3	-	3	
31	ජ්‍යෙෂ්ඨ උපදේශක	201	97	104	MA 4
32	වැඩසටහන් නිළධාරී	70	52	18	

33	සහකාර පුස්තකාලාධිපති	1	-	1	MA 3
34	ව්‍යාපෘති සහකාර*	34	6	-	
35	තාක්ෂණික සහකාර	3	1	2	MA 2-2
36	උපදේශක	1614	851	763	
37	ක්‍රීඩා උපදේශක	31	-	31	
38	තාක්ෂණික නිලධාරි (සිවිල්)	2	-	2	
39	ප්‍රමාණ සමීක්ෂක	1	-	1	
40	සැලසුම් ශිල්පී	1	-	1	
41	කළමනාකරණ සහකාර	196	154	42	MA 1-2
42	සහකාර උපදේශක (LRUC)*	38	28	-	
43	ඇමුණුම්කරු (මුද්‍රණ)	1	1	-	
44	නිවාඩු නිකේතන භාරකරු	2	-	2	
45	රියදුරු	67	46	21	PL 3
46	ගබඩාකරු*	2	2	-	PL 2
47	මුද්‍රණ සහායක	1	1	-	
48	බැඳුම්කරු (මුද්‍රණ)	1	1	-	
49	යන්ත්‍ර ක්‍රියාකරු (මුද්‍රණ)	2	2	-	
50	කාර්යාල සහායක	8	5	3	PL 1
51	මුරකරු*	65	30	-	
52	කම්කරු	101	74	27	
එකතුව		**2727**	**1515**	**1136**	

** දැනට එම තනතුර දරන පුද්ගලයින්ට පෞද්ගලික වන සේ අනුමත කර ඇත.ඔවුන් විශ්‍රාම යාම/ සේවයෙන් ඉවත් වීම සමඟ එම තනතුර අහෝසි වේ.*

මෙහෙයුම් කාර්යය මණ්ඩලය - 2024

	තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	වසර අවසානයවන විට කාර්යය මණ්ඩලය	වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය
1	HM 2-1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර HM 1-1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර	8	2	6
2	MM 1-3 විදුහල්පති	1	-	1
3	MM 1-1 කළමනාකාර	94	66	28
4	JM 1-1 කණිෂ්ඨ කළමනාකාර	178	96(*04)	79
5	MA 5-2 බලාත්මක කිරීමේ / ක්‍රියාත්මක කිරීමේ / ව්‍යාප්ති නිලධාරීන්	4	-	4
6	MA 4 ක්‍රියාත්මක කිරීමේ / උපදේශන සේවා	271	149	122
7	MA 3 ආශ්‍රිත නිලධාරීන්	35	06 (*06)	1
8	MA 2-2 කළමනාකරණ සහකාර - තාක්ෂණ	1652	852	800
9	MA 1-2 කළමනාකරණ සහකාර- තාක්ෂණ නොවන	237	183(*28)	44
10	PL 3 ප්‍රාථමික ශිල්පී	67	46	21
11	PL 2 ප්‍රාථමික අර්ධ ශිල්පී	6	06 (*02)	0
12	PL 1 ප්‍රාථමික ශිල්පී නොවන	17	109(*30)	30
එකතුව		**2727**	**1515**	**1136**

අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය - 2024



පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම

වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම.

වර්ෂයේ පූර්ණකාලීන පුහුණු වැඩසටහන් 1605 හා අර්ධකාලීන පුහුණු වැඩසටහන් 315 ක් දිවයින පුරා ක්‍රියාත්මක කර ආයතනික පුහුණුව සඳහා ඇතුලත් වූ ආධුනිකයින් සංඛ්‍යාව 31247 කි. ඉන් 2024.12.31 දිනට ආයතනික පුහුණුව අවසන් කල සංඛ්‍යාව 21847 කි. ආධුනිකයින් 7007 ක් 2025 වසරේදී පාඨමාලා අවසන් කිරීමට නියමිතය.

වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම / පුහුණුව අවසන් කිරීම

වර්ෂය	2020	2021	2022	2023	2024
පුහුණුවන්නන්ගේ ධාරිතාවය	22,450	21,800	23,180	22,315	21,445
පුහුණුවට ඇතුලත් වූ සංඛ්‍යාව	23,417	33,407	35,001	39,236	31,247
පුහුණුව අවසන් කල සංඛ්‍යාව	19,346	28,539	29,726	28,835	21,847

2025 වසරේදී පාඨමාලා අවසන් කිරීමට නියමිත ප්‍රමාණය 7007 ක් වන අතර ඒ අනුව පාඨමාලා සම්පූර්ණ කිරීමට නියමිත සංඛ්‍යාව 28854 කි.

අධ්‍යයන වාර අර්ධකාලීන සති අන්ත හා අධ්‍යයන වේලාවන් හඳුන්වා දෙමින් ආයතනික පුහුණු ධාරිතාවය ඉක්මවා ආධුනික බඳවා ගැනීම් සිදු කර ඇත.

පූර්ණකාලීන පාඨමාලා - 3815
අර්ධකාලීන පාඨමාලා - 3192
} 7007

සටහන : පුහුණු වැඩහලක එක් වරකට නිපුණතාවය ලබාදිය හැකි ආධුනික සංඛ්‍යාව ධාරිතාවය වේ.

පුහුණු පාඨමාලා ක්ෂේත්‍ර අනුව ආධුනික බඳවා ගැනීම -2024

	ක්ෂේත්‍රය	ඇතුළත් වූ ආධුනික සංඛ්‍යාව (ආයතනික පුහුණුව)			ප්‍රතිශතය
		පිරිමි	කාන්තා	එකතුව	
1	කෘෂිකර්ම වැවිලි හා පශු සම්පත්	43	53	96	0.31 %
2	මෝටර් රථ අළුත්වැඩියා හා නඩත්තුව	2368	28	2396	7.67 %
3	ගොඩනැගිලි හා ඉදිකිරීම්	2226	338	2564	8.21 %
4	විදුලි හා විද්‍යුත් සහ විදුලි සංදේශ	2523	36	2559	8.19 %
5	ආහාර තාක්ෂණය	1056	526	1582	5.06 %
6	මැණික් හා ස්වර්ණාභරණ	43	39	82	0.26 %
7	හෝටල් හා සංචාරක	3046	598	3644	11.66 %
8	තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය	2949	4710	7659	24.51 %
9	සම් ආශ්‍රිත නිෂ්පාදන	23	-	23	0.07 %
10	ලෝහ හා ලුහු ඉංජිනේරු	1041	6	1047	3.35 %
11	කාර්යාල කළමනාකරණය	5	116	121	0.39 %
12	දැව ආශ්‍රිත	746	35	781	2.50 %
13	මුද්‍රණ හා ඇසුරුම්	1283	4242	5525	17.68 %
14	මුද්‍රණ හා ඇසුරුම්	41	14	55	0.18 %
15	ශීතකරණ හා වායුසමීකරණ	528	-	528	1.69 %
16	රෙදිපිළි හා ඇඟළුම්	385	2058	2443	7.82 %
17	සෞඛ්‍ය හා සමාජ කටයුතු	27	75	102	0.33 %
18	වෙනත්	40	-	40	0.13 %
එකතුව		18373	12874	31247	100.00%

වෘත්තීය පුහුණුව සඳහා කාන්තා සහභාගිත්වය 41% කි.

ආයතනික පුහුණුව සඳහා ඇතුළත් වූ කාන්තා හා පිරිමි ආධුනික සංඛ්‍යාව



සාමාජය ඉල්ලුම වැඩි හා ස්වයං රැකියා, රැකියා අවස්ථා බහුල පාඨමාලා ක්ෂේත්‍ර

ක්ෂේත්‍රය	පිරිමි	ගැහැණු	එකතුව	ප්‍රතිශතය
තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය	2949	4710	7659	24.51%
පුද්ගල හා සමාජ	1283	4242	5525	17.68%
රෙදිපිළි හා ඇගළුම්	385	2058	2443	7.82%
ආහාර තාක්ෂණය	1056	526	1582	5.06%
එකතුව	5673	11536	17209	55.07%



ශ්‍රම වෙළඳපොල ඉල්ලුම සහිත රැකියා අවස්ථා බහුල පාඨමාලා සඳහා ඇතුලත්වන ආධුනික සංඛ්‍යාව සමස්ත ඇතුලත් විමෙන් 43.27% කි.

ක්ෂේත්‍රය	පිරිමි	ගැහැණු	එකතුව	ප්‍රතිශතය
මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තුව	2368	28	2396	7,67 %
ගොඩනැගිලි හා ඉදිකිරීම්	2226	338	2564	8,21 %
විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ	2523	36	2559	8,19 %
හෝටල් හා සංචාරක	3046	598	3644	11,66 %
දැව ආශ්‍රිත	746	35	781	2,50 %
ශීතකරණ හා වායුසමීකරණ	528	-	528	1,69 %
ලෝහ සහ ලුහු ඉංජිනේරු	1041	6	1047	3,35 %
එකතුව	12478	1041	13519	43,27 %

මෙම ක්ෂේත්‍රයන් තරුණයින් වඩා ආකර්ෂණීය වන පාඨමාලාවන් වුවද 8% ක කාන්තා සහභාගීත්වයක් ද පවතී.



සෘජුව රැකියාගත නොවන රැකියා අවස්ථාවන් සඳහා උපකාරී වන පාඨමාලා-2024

පාඨමාලාව (Course)		ඇතුලත් වූ සංඛ්‍යාව (Enrolment)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී	(Level 5)	21
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී	(Level 4)	2896
පරිගණක දෘඪාංග ශිල්පී	A Plus	774
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී	(Level 3)	1160
පරිගණක දෘඪාංග ශිල්පී		106
එකතුව		4957

රජයේ ප්‍රතිපාදන ප්‍රතිලාභයන් පුහුණුවන්නන් වෙත ලබා දීම

2024 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත ප්‍රාග්ධන වෙන් කිරීම් ලෙස රු.මිලියන 120 ක් වෙන් විය. ඉන් 59% ක් එනම් රු.මිලියන 70 ක් පාඨමාලා ක්ෂේත්‍ර 10 ක පුහුණු උපකරණ අවශ්‍යතා සපුරාලීමට යෙදවීය. එහි ප්‍රතිලාභය සෘජුව පුහුණුවන්නන් වෙත ලබා දීමට හැකිවීම සුවිශේෂී අවස්ථාවකි.

එසේම වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් 18% ක් පුහුණු මධ්‍යස්ථාන 7 ක පුහුණු වැඩහල් සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යෙදවීය.



කාර්යය මණ්ඩලයේ දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කාර්යය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය වාර්ෂිකවම සිදුකරනු ලැබේ. ඒ සඳහා 2024 වර්ෂයේ ද ප්‍රතිපාදන වෙන් කරනු ලැබීය.එසේ වුවද උපදේශක බඳවා ගැනීම් අත්හිටුවීම මත අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීමට 2024 වසර තුලදී නොහැකි විය.

එහෙත් සේවයේ යෙදී සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පෞද්ගලික අංශයේ අනුග්‍රහයන් මත නිලධාරීන් 881 දෙනෙකු පුහුණු කිරීමට හැකිවිය.

අධ්‍යයන කාර්යය මණ්ඩල පුහුණු කිරීම්

	ක්ෂේත්‍රය	පුහුණුවන්නන් සංඛ්‍යා
1	ජලනල කාර්මික ශිල්පී	17
2	ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී	38
3	වෑද්දුම් ශිල්පී	4
4	සූපවේදී	54
5	තොරතුරු තාක්ෂණය ශිල්පී	584
6	ශීතකරණ හා වායුසමීකරණ ශිල්පී	35
7	උපදේශකවරු සඳහා කර්මාන්ත නිරාවරණ පුහුණු වැඩසටහන	14
8	බේකරි ආහාරපාන ශිල්පී	20
9	රූපලාවන්‍ය හා කොණ්ඩා සැකසුම් ශිල්පී	10
10	ඇළුමිණියම් පිරිසැකසුම් ශිල්පී	5
11	මෝටර් කාර්මික ශිල්පී සහ මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී	11
12	රෙදිපිළි හා ඇගළුම්	55
13	විදුලි කාර්මික ශිල්පී	12
14	පුහුණු ක්‍රමවේද පිළිබඳ වැඩසටහන	22
එකතුව		**881**

අනධ්‍යයන කාර්යය මණ්ඩල පුහුණු කිරීම්

	පුහුණු වැඩසටහන	ඉලක්කගත කණ්ඩායම	සහභාගි වූ නිලධාරීන්
1	කළමනාකරණ සහ නායකත්ව වැඩමුළුව	කළමනාකරු (MM) කණිෂ්ඨ කළමනාකරු (JM)	99
2	“Busy System” වැඩමුළුව	කළමනාකාර සහකාර	35
3	රාජ්‍ය වැටුප් සැකසුම් වැඩසටහන	ගිණුම් අංශයේ නිලධාරීන්	02
4	කාර්යාල කළමනාකරණය, ආචාරධර්ම, කණ්ඩායම් සහයෝගිත්වය පිළිබඳ වැඩමුළුව	කළමනාකාර සහකාර සහ ප්‍රාථමික සේවා කාණ්ඩය (PL)	123
5	මූල්‍ය රෙගුලාසි	කළමනාකාර සහකාර	50
6	ප්‍රසම්පාදන ක්‍රියාවලිය	කළමනාකාර සහකාර	40
7	වැඩසටහන් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	සහකාර අධ්‍යක්ෂ වැඩසටහන් නිලධාරී ජ්‍යෙෂ්ඨ උපදේශක	43
8	දෙමළ භාෂා පාඨමාලාව (පැය 200 සහ පැය 100)	කළමනාකරු කාණ්ඩය(MM) ප්‍රාථමික සේවා කාණ්ඩය (PL)	57
එකතුව			**449**

විදේශීය පුහුණුව - 2024

වෘත්තීය අධ්‍යාපන අංශය උදෙසා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් මෙම විදේශ පුහුණු වැඩසටහන් පිරිනමන අතර 2024 වර්ෂය තුළ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත විදේශ ශිෂ්‍යත්ව 08 ක් පිරිනමා ඇත.

විධායක, වැඩසටහන් නිලධාරීන් හා උපදේශක ගණයට අයත් වන නිලධාරීන් 12 දෙනෙකු ලබා ගත් කෙටිකාලීන පුහුණුව හා අධ්‍යයනය වෘත්තීය අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් උදෙසා වූ මහඟු අවස්ථාවකි. මනා පිටුවහලක් විය.

එමගින් නවතම තාක්ෂණික දැනුම, ආධුනිකයින් වෙත ද ලබා දීමට කටයුතු කෙරේ.

	ශිෂ්‍යත්වය	රට	සහභාගි වූ සංඛ්‍යාව
1	තරුණ නායකයින් පුහුණු වැඩසටහන (JICA)	ජපානය	01
2	සංවර්ධනය වෙමින් පවතින රටවල වෘත්තීය අධ්‍යාපන ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණය	චීනය	02
3	සංවර්ධනය වෙමින් පවතින රටවල ගුරුවරුන් සඳහා වෘත්තීය අධ්‍යාපන, ඩිජිටල්කරණය පිළිබඳ සම්මන්ත්‍රණය	චීනය	01
4	අධ්‍යාපන ආයතන සඳහා කර්මාන්ත නිපුණතාවය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	ඉන්දියාව	02
5	කාර්මික ස්වයංක්‍රීය කරණය පිළිබඳ පාඨමාලාව	ඉන්දියාව	01
6	දකුණු ආසියානු උසස් වෘත්තීය පාසල් පිළිබඳ අධ්‍යාපන චාරිකාව	කොරියාව	01
7	දෙමුහුන් වාහන තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	චීනය	03
8	නව නිමැවුම් හා ව්‍යවසායකත්ව පුහුණුව	චීනය	01
එකතුව			**12**

වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය

2024 වර්ෂයේ දිවයින පුරා ක්‍රියාත්මක වූ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත පරිදි වේ.

පුහුණු මධ්‍යස්ථාන	2022	2023	2024
ජාතික වෘත්තීය පුහුණු ආයතනය (NVTI)	08	08	08
දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන (DVTC)	22	22	22
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන (VTC)	179	172	162
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අනෙකුත් මධ්‍යස්ථාන (බන්ධනාගාර හා පුනරුත්ථාපන)	03	02	02
එකතුව	**212**	**204**	**194**

පහත නිර්ණායක ඔස්සේ 2024 වර්ෂය තුලදී ඵලදායීව ක්‍රියාත්මක නොවන වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන 10 ක් ක්‍රියාත්මක නොකර පාඨමාලා ආසන්නතම මධ්‍යස්ථානය වෙත අනුයුක්ත කරනු ලැබීය.

- මධ්‍යස්ථාන හිමිකාරිත්වය ආයතනය සතු නොවීම මත වැඩිදියුණු කිරීම් සිදු කර ගත නොහැකි වීම.
- මධ්‍යස්ථාන යටිතල පහසුකම් වල තත්ත්වය
- මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක වන පාඨමාලා සංඛ්‍යාව 3 ට අඩු වීම හා ආධුනික බඳවා ගැනීම් ප්‍රමාණවත් නොවීම.



වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය 2024

පළාත	දිස්ත්‍රික්කය	ආයතන සංඛ්‍යාව					Total
		NVTI	DVTC	VTC	Attachment	Prison Camp	
බස්නාහිර	ගම්පහ	-	1	10	2	-	11
	කොළඹ	3	1	10	-	-	14
	කළුතර	-	1	8	1	1	9
වයඹ	පුත්තලම	-	1	6	-	-	7
	කුරුණෑගල	-	1	5	-	-	6
උතුර	යාපනය	-	1	5	-	-	6
	කිලිනොච්චිය	-	1	4	-	-	5
	මුලතිව්	-	1	2	-	-	3
	මන්නාරම	-	-	1	-	-	1
	වව්නියාව	-	1	3	1	-	4
නැගෙනහිර	ත්‍රිකුණාමලය	-	1	6	-	-	7
	මඩකලපුව	1	-	10	-	-	11
	අම්පාර	-	1	10	1	-	11
දකුණ	ගාල්ල	2	1	11	2	-	14
	මාතර	1	-	12	-	-	13
	හම්බන්තොට	1	1	7	-	-	9
සබරගමුව	කෑගල්ල	-	1	7	1	1	8
	රත්නපුරය	-	1	9	-	-	10
ඌව	බදුල්ල	-	1	7	-	[1]	9
	මොණරාගල	-	1	6	-	-	7
මධ්‍යම	මහනුවර	-	1	8	-	2	9
	මාතලේ	-	1	3	-	-	4
	නුවරඑළිය	-	1	4	-	-	5
උතුරු මැද	අනුරාධපුර	-	1	6	1	-	7
	පොලොන්නරුව	-	1	2	-	[1]	4
එකතුව		**8**	**22**	**162**			**194***

NVTI	-	ජාතික වෘත්තීය පුහුණු ආයතන	8
DVTC	-	දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	22
VTC	-	වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	164 බන්ධනාගාර මධ්‍යස්ථාන [2]
Attachment	-	අනුබද්ධිත	
Prison Camp	-	බන්ධනාගාර	
[ ]	-	පුහුණු මධ්‍යස්ථාන ලෙස TVEC ලියාපදිංචිව ඇති මධ්‍යස්ථාන	

*TVEC හි ලියාපදිංචි මධ්‍යස්ථාන සංඛ්‍යාව



මධ්‍යස්ථාන 194

ජාතික වෘත්තීය පුහුණු ආයතන (NVTI) - 08

1. නාරාහේන්පිට
2. තලල්ල
3. රත්මලාන
4. මිරිජ්ජවිල
5. නියාගම
6. බද්දේගම
7. මඩකලපුව
8. ඔරුගොඩවත්ත

දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන (DVTC) - 22 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන (VTC) - 164

වෘත්තීය පරීක්ෂණ හා ඇගයීම්

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පුහුණුව ලත් ආධුනිකයින් ඇගයීම් ක්‍රමවේදයන් මගින් ඇගයීම් කර සහතිකපත්ලාභීන් බවට පත්කරනු ලැබේ. මේ සදහා වාර්ෂිකව රුපියල් මිලියන 73 කට අධික මුදලක් වැයකරනු ලැබේ. වෘත්තීය පුහුණුව කෙරෙහි ඇති සාධනීය අභිප්‍රේරනයක් නිරූපණය කරමින් 2024 වර්ෂයේදී ඇගයීම් සිදුකර නිකුත් කල සහතිකපත් ප්‍රමාණය 31829 කි. එය 2024 වර්ෂයට වඩා 5% ක වැඩිවීමකි

අංකය	වර්ෂය	2020	2021	2022	2023	2024
01	ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)	17243	13746	17734	22635	24658
02	වෘත්තීය පුහුණු සහතිකපත් (VTA Certificates)	962	3587	2356	4139	3571
03	පෙරදැනුම ඇගයීම් ක්‍රමය (RPL)	648	1413	3006	3487	3600
එකතුව		**18853**	**18746**	**23096**	**30261**	**31829**





ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - වාර්ෂික වාර්තාව 2024

වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය

පසුගිය කාලවකවානුව උද්ගත වූ ආර්ථික අවපාතයන්ට සමගාමීව බහුතරයක් තරුණ තරුණියන් විදේශ රැකියා කෙරෙහි යොමු වීමේ අභිලාෂයෙන් වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරීමට උත්සුක විය. ඔවුනට වෘත්තීය පුහුණුව හා නිපුණතා සංවර්ධනය පිළිබඳව ඇති අවබෝධය ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

ඒ පිළිබඳව ද සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සිය කාර්යභාරයේ ප්‍රධාන අංගයක් වන වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය වඩාත් ප්‍රචලිත කිරීමට කටයුතු කරනු ලැබීය.ඒ සඳහා සුදුසුකම්ලත් නිලධාරී මණ්ඩලයක් ආයතනය සතුව පවතින අතර ග්‍රාමීය මට්ටමේ සිට නාගරික මට්ටම දක්වා තරුණ තරුණියන්ගේ රුචිකත්වය මත ඔවුන්ගේ අනාගත දිශානතියට ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනීමට මඟ පෙන්වීමක් සිදු කරනු ලබයි.

ඒ අනුව 2024 වර්ෂය තුළ සිදු කරන ලද වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පහත පරිදි වේ.

ඉලක්කගත කණ්ඩායම	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
පාසැල් සිසුන්	1017	50624
පාසැල් හැරයන්නන්	534	20843
පුහුණුවන්නන්	1226	38133
දෙමාපියන්	508	20317
වෙනත්	830	42658
එකතුව	**4115**	**172575**

2024 වර්ෂයේ පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සංඛ්‍යාව



2024 වර්ෂයේ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව



කර්මාන්ත සබඳතා හා රැකියාගත කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණුවන්නන් සතු න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික කුසලතා තවදුරටත් වැඩිදියුණු කර ගැනීම සඳහා යොමු කිරීම තුළින් ඒ ඒ ක්ෂේත්‍රයන්හි නිපුණ ශිල්පීන් බිහි කිරීමට උර දෙන ප්‍රධාන ඒකකයක් ලෙස කර්මාන්ත සබඳතා ඒකකය හැඳින්විය හැක.

වර්තමානය වන විට මෙම ඒකකය කර්මාන්ත ක්ෂේත්‍රයේ දැවැන්තයින් සමඟ සම්බන්ධතා ගොඩ නඟා ගනිමින් වෘත්තීය පුහුණුව ලැබූ තරුණ තරුණියින් විශාල පිරිසක් ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කරමින් සිටී.මෙසේ වැඩිදුර පුහුණුව සඳහා යොමු කරන පුහුණුලාභීන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ලියාපදිංචි කරන ලද දේශීය හා විදේශීය රැකියා ආයතන මගින් රැකියාගත කරනු ලබයි.මෙය රැකියා විරහිත තරුණ තරුණයින්ගේ රැකියා හිඟයට විසඳුමක් මෙන්ම විදේශීය විනිමය රට තුළට රැගෙන ඒම සඳහා රුකුලක් වී ඇත.

තවද අද වන විට කර්මාන්ත ක්ෂේත්‍රය තුළ නවීන ශිල්පීය ක්‍රමවේදයන් දිනපතා අලුත් වෙමින් පවතී.එවන් පරිසරයකට පිවිසෙන අපගේ පුහුණුවන්නන් නිරතුරුවම එම දැනුම යාවත්කාලීන කරනු ලබයි. ඒ සඳහා නිරන්තරයෙන්ම කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් සමඟ සාකච්ඡා කරමින් එම දැනුම පුහුණුවන්නන්ට ලබා දීමට කටයුතු කරනු ලබයි. එමෙන්ම පුහුණු වන කාලය තුලදී කර්මාන්ත නිරීක්ෂණ චාරිකා සඳහා පුහුණුවන්නන් යොමු කරමින් වැඩලෝකය පිළිබඳ දැනුම ලබා දීමට ද එම ඒකකයේ නිලධාරීන් කටයුතු කරනු ලැබේ.

සහතිකපත්ලාභී තරුණ තරුණියන් රැකියාගත කරනු ලබන අතර පුහුණුව අවසන වන පහත වර්ගීකරණයන්ට ලක්වන සියල්ලන් රැකියාගත කිරීමට ලක් නොවේ.ඒ අනුව සහතිකපත්ලාභීන්ගෙන් 60% ක පමණ ප්‍රමාණයක් රැකියාගත කරනු ලැබේ.

- වෘත්තීය පුහුණු පාඨමාලා හදාරනු ලබන ත්‍රිවිධ හමුදා සාමාජිකයින්
- බන්ධනාගාර රැඳවියන්
- පහත පාඨමාලා හදාරනු ලබන පුහුණුලාභීන්ගේ සැලකිය යුතු පිරිසක් තම පෞද්ගලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට පුහුණුව ලබා ගනු ලැබේ.

  a) රූපලාවන්‍ය

  b) කොණ්ඩා සැකසුම්

  c) සාමාන්‍ය මැහුම්

- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 හා 4 හදාරා ඉදිරි NVQ මට්ටම් හැදෑරීමට බලාපොරොත්තු වන ආධුනිකයින් හා උසස් අධ්‍යාපනයට යොමුවන්නන්
- දැනුම, කුසලතා වර්ධනය කර ගැනීම අරමුණු කර ගත් අර්ධකාලීන පාඨමාලා හදාරනු ලබන රැකියාවන්හි නියුක්තිකයින්
- එමෙන්ම ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථාන වල පුහුණුව ලැබූ වැඩි පිරිසක් (මෙම පිරිස රැකියා බහුලව කේන්ද්‍රීයව පවතින නාගරික ප්‍රදේශයන්හි රැකියාගත වීමට ඇති අකමැත්ත හා ගෙවනු ලබන වැටුප් ඔවුනට නේවාසිකව සිට රැකියා කිරීමට ප්‍රමාණවත් නොවීම).
- අප ආයතනයේ ලියාපදිංචි නොවූ විදේශ රැකියා නියෝජිත ආයතන මගින් විදේශ රැකියා සඳහා යොමුවන්නන්.

ඒ අනුව 2024.12.31 දින වන විට දත්ත තහවුරු කර ගත් පුහුණුලාභීන් 12809 ක් රැකියාගත කරනු ලැබූ අතර අනෙකුත් රැකියා ස්ථානගත වීම් තහවුරු කර ගනිමින් පවතී.

අංකය	පුහුණු ක්ෂේත්‍රය	රැකියා ගත කල සංඛ්‍යාව			
		දේශීය	විදේශීය	ස්වයං	එකතුව
01	ගොඩනැගිලි හා ඉදිකිරීම්	1059	20	147	1226
02	මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව	1221	14	58	1293
03	විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ	1155	18	138	1311
04	ශීතකරණ හා වායු සමීකරණ	303	10	3	316
05	ආහාර තාක්ෂණය	1174	46	47	1267
06	සන්නිවේදනය හා බහුමාධ්‍ය තාක්ෂණය	1537	13	63	1613
07	හෝටල් හා සංචාරක	1514	23	22	1559
08	ලෝහ හා ලුහු ඉංජිනේරු	513	16	18	547
09	දැව ආශ්‍රිත	266	2	59	327
10	මැණික් හා ස්වර්ණාභරණ	10	6	5	21
11	මුද්‍රණ හා ඇසුරුම්	9	-	2	11
12	රෙදිපිළි හා ඇගලුම්	1163	9	530	1702
13	පුද්ගල හා සමාජ	1302	19	223	1544
14	කෘෂිකාර්මික වැවිලි හා පශු සම්පත්	28	1	-	29
15	සම් ආශ්‍රිත නිෂ්පාදන	-	-	1	1
16	කාර්යාල කළමනාකරණය	40	2	-	42
එකතුව		**11294**	**199**	**1316**	**12809**

වර්ගය	ස්ථාපනය කළ සංඛ්‍යාව	ජාතික ආර්ථික දායකත්වය (රු මිලියන) (උපකල්පිත)
දේශීය රැකියා	11,294	6,560.32
විදේශීය රැකියා	199	400.08
ස්වයං රැකියා	1,316	1,004.46
එකතුව	**12,809**	**7,964.86**



රැකියාගත කිරීම

- දේශීය
- විදේශීය
- ස්වයං

රැකියා ස්ථාපනය හා ජාතික ආර්ථික දායකත්වය (දළ වශයෙන්)

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ශ්‍රම වෙළඳපොල සගරාව හා රැකියාගත කළ ආයතනයන්හී දත්ත මත රැකියාගත වූ එක් අයෙකුට ඒ ඒ රැකියාව අනුව හිමි මාසික වැටුප අනුව වර්ෂයක් තුල ඉපයූ ආදායම ගණනය කර ජාතික ආර්ථිකයට දැක් වූ දායකත්වය ගණනය කර ඇත.

උදාහරණ :- සූපවේදි පාඨමාලාව (පුද්ගලයින් 10 දෙනෙකු සඳහා)

වර්ගය	මාසික ආදායම	ජාතික ආර්ථිකයට දැක් වූ දායකත්වය මාසික රු.	ජාතික ආර්ථිකයට දැක් වූ දායකත්වය වාර්ෂික රු.
දේශීය	50,000.00	500,000.00	6,000,000.00
විදේශීය	190,000.00	1,900,000.00	22,800,000.00
ස්වයං	75,000.00	750,000.00	9,000,000.00

වර්ෂ 5 ක වාර්තා වූ රැකියාගත කිරීම්

වර්ෂය	දේශීය රැකියා	විදේශීය රැකියා	ස්වයං රැකියා	එකතුව
2020	2316	13	426	**2755**
2021	935	28	175	**1138**
2022	4519	139	1027	**5685**
2023	14096	351	1654	**16101**
2024	11294	199	1316	**12809**

(ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් රැකියාගත කල තොරතුරු පමණි)



රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන්

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය දැනුමින් කුසලතාවන්ගෙන් පිරිපුන් පුද්ගලයින් වැඩබිමට දායාද කිරීමට නිරන්තර උත්සහයක් ගනී. ඒ සඳහා පෞද්ගලික අංශය හා එක්ව විවිධ ශිල්පීය දැනුම හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මේ තුළින් වැඩ ලෝකයේ කුසලතාවන්ගෙන් පෝෂිත වූ පුහුණුවන්නකු බිහි කිරීම මූලික අභිප්‍රාය වේ. 2024 වසර තුළදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	අනුග්‍රාහක ආයතන
ටයිල් ඇතිරීම	13	477	ලංකා ටයිල්ස් සමාගම
රූපලාවන්‍ය, කොණ්ඩා කැපීම	7	730	නේචර්ස් බියුටි ක්‍රියේෂන්, ටියාරා මාකටින් සමාගම
ඇලූමිනියම් පිරිසැකසුම්	6	243	ස්විස්ටෙක් ඇලූමිනියම් /Alumex
විදුලි කාර්මික	6	259	ACL කේබල්ස්
බේකරි නිෂ්පාදන	2	60	Keels Food/AB Mayuri
යතුරු පැදි හා ත්‍රි රෝද රථ නඩත්තුව	1	16	TATA Company
පෑස්සුම් ශිල්පය	1	32	Maharaja
එකතුව	**36**	**1817**	

පෞද්ගලික අංශයේ අනුග්‍රහයන් මත සිදුවන බැවින් ආයතනයන් විසින් වසරකට එකඟ වන වැඩසටහන් සංඛ්‍යාව තීරණය වේ.

ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

තරුණ ව්‍යවසායකයින් දිරිගන්වමින් ඔවුන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩි දියුණු කිරීම හා ඔවුන්ට අත හිත දීම ද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තවත් එක් ප්‍රමුඛ අරමුණකි.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලා හදාරනු ලබන තරුණ තරුණියන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 14 ක් පවත්වා 249 ක් සදහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදීමට හැකි විය.වසරකට වෙන් වන ප්‍රතිපාදන මත පුහුණු කාර්යයන් සිදුකර ඇත.



අභියෝග

01 නිෂ්පාදන ආර්ථිකයක් රට තුළ ස්ථාපිත කිරීමට වෘත්තීය අධ්‍යාපනය තුළින් ලබා ගත හැකි දායකත්වය ඉහළ මට්ටමක පවතින අතර ඒ පිළිබඳව සමාජය දැනුවත් කිරීමට ආකල්ප සංවර්ධනයට පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් දියත් කිරීමට අවශ්‍ය භෞතික හා මූල්‍ය සම්පත් මෙන්ම ප්‍රතිපත්තිමය තීරණ අවශ්‍ය වීම.

02 වෘත්තීය පුහුණුව සපයන පෞද්ගලික අංශයේ ආයතන විවිධ අලෙවිකරණ උපක්‍රම භාවිතා කරමින් කටයුතු කලද එවැනි ආයතන හා තරඟකාරීව කටයුතු කිරීමට අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් නොමැති වීම.

03 පාසල් අධ්‍යාපන පද්ධතියෙන් උසස් අධ්‍යාපනයට යොමු නොවන තරුණ තරුණියන් ආසන්න වශයෙන් වසරකට 150,000 ක් පමණ වේ.ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු ධාරිතාවය අනුව එම ප්‍රමාණයෙන් වසරකට 40,000 ක පමණ ප්‍රමාණයක් පුහුණුව සඳහා බඳවා ගැනීමට කටයුතු කලද එම ඉලක්කය කරා යාමට පවතින උපදේශකවරුන්ගේ හිඟය දැඩි ලෙස බලපෑම.

04 කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළ ශ්‍රම ඉල්ලුමක් ඇති ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා ඇති අඩු ඉල්ලුම.

05 පුහුණු වැඩසටහන්හි ගුණාත්මකභාවය හා නිරන්තර වැඩිදියුණු කිරීම් සඳහා දැනුම, හැකියාව හා පලපුරුද්ද ඇති උපදේශකවරුන් අඩු වැටුප් පරිමාව මත රඳවා ගැනීමට අපහසු වීම.

ව්‍යාපෘති වියදම්	5.33	75.69	118.27	183.44	170.20	195.65	175.43	90.71	197.30	259.09	280.38	284.63
මුළු වියදම	1,443.35	1,639.09	1,913.21	2,013.07	2,172.30	2,008.17	2,454.30	2,437.71	2,409.47	2,652.00	3,267.12	3,218.65
අතිරික්තය/(ඌනතාවය)	(53.96)	(76.46)	(75.34)	33.28	(132.12)	(128.95)	(77.30)	(34.51)	(564.86)	(471.06)	(958.02)	(576.33)
ශුද්ධ ස්ථාවර වත්කම්	5,380.76	5,383.09	5,387.25	5,420.89	5,438.45	6,191.13	6,509.20	8,034.59	7,761.26	7,900.96	7,106.46	6,838.80
ජංගම වත්කම්	147.59	170.47	194.29	264.68	228.78	341.69	308.58	266.42	243.84	230.30	371.80	458.20
	5,528.35	5,553.55	5,581.54	5,685.57	5,667.23	6,532.82	6,817.78	8,301.01	8,005.10	8,131.26	7,478.25	7,297.00
හිමිකම්	5,187.09	5,149.05	5,095.95	5,223.99	5,145.10	5,784.72	6,016.84	7,513.19	7,182.79	7,257.34	6,567.03	6,287.35
වෙන්කිරීම්	234.26	283.27	373.82	306.15	369.32	437.39	506.84	587.43	612.12	641.38	624.12	770.14
වගකීම්	106.99	121.23	111.76	155.42	152.82	310.71	294.10	200.39	210.20	232.54	287.11	239.51
	5,528.35	5,553.55	5,581.54	5,685.57	5,667.23	6,532.82	6,817.78	8,301.01	8,005.10	8,131.26	7,478.25	7,297.00

M-08
Set Hair
M-09
Use of Wigs
M-10
Maintain Machinery, Tools,
Equipment & Materials
M-12
K -07

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VOT/D/VTA/1/2024/27 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි දින

සභාපති

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No.	VOT/D/VTA/1/2024/27	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2025 මැයි දින

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 14(අ) හා (ආ) ඡේද අනුව වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවන් අස්ථිත්වයට ගලා ඒමේ සම්භාවිතාවක් ඇතිවිට සහ වත්කමෙහි පිරිවැය හෝ සාධාරණ අගය විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විට පමණක් වත්කමක් ලෙස හඳුනාගත යුතු වුවද අධිකාරිය විසින් පුහුණු මධ්‍යස්ථාන ලෙස භාවිතා කරනු ලබන ඉඩම් හා එම ඉඩම්වල ඉදිකරන ලද ගොඩනැගිලි 28 ක වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හෝ 2024 මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් හෙළිදරව් කිරීමට හෝ සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය අනුව ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට සෑම වර්ෂ තුනකට හෝ වර්ෂ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් අධිකාරිය විසින් ප්‍රත්‍යාගණන ආකෘතියට ගිණුම් තබා ඇති රු.5,883,872,047 ක වටිනාකමින් යුතු ඉඩම්, ගොඩනැගිලි හා මෝටර්රථ වර්ෂ 06 සිට වර්ෂ 16 දක්වා කාලපරිච්ඡේදයක් තුළ ප්‍රත්‍යාගණනය සිදුකර නොතිබීම හේතුවෙන් එම වත්කම් පංති 03 හි සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුළින් නිරූපණය නොකෙරුණි.

(ඇ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ඉඩම් සාරාංශය අනුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පවත්වනු ලබන ඉඩම් 97 ක් විධිමත් පරිදි පවරාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2023 වර්ෂයේ SFIG (Skill for Inclusive Growth) ව්‍යාපෘතිය මඟින් ගොංගම හා කඳුරුවෙල පුහුණු මධ්‍යස්ථාන සඳහා ලැබී තිබූ වටිනාකම රු.65,170,697 ක් වූ ස්ථාවර වත්කම් ද රු.4,500,165 ක් වූ පුහුණු ද්‍රව්‍ය ද 2022 වර්ෂයේදී ලැබී තිබූ රු.1,777,500 ක් වූ මාධ්‍ය උපකරණ ද මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ විගණන වාර්තාව මඟින්ද පෙන්වා දී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2025 ජනවාරි මාසය තුළදී අධිකාරිය වෙත ලැබී තිබුණු රු.7,839,896 ක් වටිනා පුහුණු උපකරණ සමාලෝචිත වර්ෂයේ වත්කම ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරියත හා උපකරණ වටිනාකම හා උපචිත වියදම් අගය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව කෑගල්ල දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායම හා නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ උපචිත වියදම්. එම ආයතන වලින් ලබාගත් තොරතුරු අනුව සැසඳීමේදී එම ආදායමෙහි හා උපචිත වියදමෙහි රු.465,025 ක හා රු.3,692,942 ක නොසැසඳීමක් පැවතුණි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } VOT/D/VTA/1/2024/27

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2025 මැයි දින

(උ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව පාරිතෝෂික ගෙවීම් ඊට අදාල ලෙජරය සමඟ සැසඳීමේදී රු.1,949,314ක නොසැසඳීමක් පැවතුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත ලබා දී තිබූ උපදේශකවරුන්ගේ දීමනාව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.117,702,315 ක් වුවද අමාත්‍යාංශය මගින් ලබා දී තිබූ තොරතුරු අනුව එම දීමනාව රු.116,987,988 ක් වූයෙන් රු.714,327 ක නොසැසඳීමක් පැවතුණි.

(ඍ) 2023 වර්ෂයට අදාළව රු.539,975 ක් වූ පාඨමාලා ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඎ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිල්ලක පොල්ගහවෙල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙනයාම වෙනුවෙන් 2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු රු.649,130 ක හිඟ කඩ කුලී මුදල හඳුනාගෙන කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

මගේ අංකය / எனது இல. / My No. VOT/D/VTA/1/2024/27 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි දින

ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර. එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද. අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. VOT/D/VTA/1/2024/27 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි දින

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් අතරින් මෙම වාර්තාවේ 1.2 ඡේදයේ (අ), (ආ) හා (ඉ) කරුණු හැර අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි 257, 272 හා 322(1)	මූල්‍ය පාලනයට සම්බන්ධ සියලුම කටයුතු කිසිදු අභ්‍යන්තර පාලනයකින් තොරව හා මුදල් රෙගුලාසිවලට අනුකූල නොවන ලෙස කටයුතු කර තිබුණි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ii.	මුදල් රෙගුලාසි 1646	2024 වර්ෂය සඳහා අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ වාහන 23 ක් හා දිස්ත්‍රික් කාර්යාලවල වාහන 69 ක් ලෙස එකතුව වාහන 92 කට අදාල දෛනික ධාවන සටහන් 2025 මාර්තු 31 දින දක්වාම විගණනයට ඉදිරිපත් නොකරැණි.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ)	යම් විශේෂිත කාර්යයක් සඳහා එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් අතුරු අග්‍රිම ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස අවස්ථා 03 කදී රු.101,480 සිට රු. 558,219 ක පරාසයක් තුල අතුරු අග්‍රිම ලබාදී තිබුණි.
(ඇ)	නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා කාර්‍ය නිපැයුම් අංශයේ ලේකම්ගේ 2020 දෙසැම්බර් 30 දිනැති අංක ADM/24/02/01(vol1-11) දරන ලිපිය	2019 දෙසැම්බර් 19 සිට අධ්‍යක්ෂ (මුදල්) තනතුර හා 2015 වර්ෂයේ සිට අධ්‍යක්ෂ (සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන) තනතුර හා ප්‍රධාන අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා වැඩ බැලීමේ / රාජකාරී ඉටුකිරීමේ පදනම් මත නිලධාරීන් පත්කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

(අ) 2024 ජනවාරි සිට ජුනි දක්වා කාලපරිච්ඡේදය තුල ඓරගම්මන හා ඇළුත්පිටිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල සිසුන් 34 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වනු ලැබූ මෝටර් සයිකල් පාඨමාලාව සඳහා අවශ්‍ය විද්‍යුත් මෝටර් සයිකල් 02 ක ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි අකාර්යක්ෂමතාව හේතුවෙන් මිලදී ගැනීම් කටයුතු සිදු නොකිරීම නිසා සිසුන්ට වෙනස ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) Care Giver පාඨමාලාව සඳහා අවශ්‍ය Anatomy Body Structure උපකරණ මිලදී ගැනීම සඳහා 2024 වර්ෂයේදී ලංසු කැඳවීමේදී පිරිවිතර නිවැරදිව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත මිලට වඩා රු.260,000 ක් එනම් සියයට 144 ක් වැඩි මිලක් ඉදිරිපත් කළ ලංසුකරුගෙන් මිලදීගෙන තිබුණි

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. — VOT/D/VTA/1/2024/27	ඔබේ අංකය / உமது இல. / Your No. —	දිනය / திகதி / Date — 2025 මැයි දින

2.3 වෙනත් කරුණු

(අ) අධිකාරියේ උපදේශකවරුන් 1,614 දෙනෙකු සිටිය යුතු වුවද වර්තමානය වන විට ඉන් ස්ථිර උපදේශකවරුන් 595 දෙනෙකු වූ අතර 2007 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුලදී කොන්ත්‍රාත් පදනම් මත උපදේශකවරුන් 271 දෙනෙකු බඳවාගැනීම සිදුකර තිබුණි. අධිකාරිය මඟින් පවත්වනු ලබන පාඨමාලා සඳහා අවශ්‍ය උපදේශකවරුන් බඳවා ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු නොවීම හේතුවෙන් පුහුණු මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම ගැටළු සහගත වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මේ නිපුණතා සංවර්ධන අංශයේ භෞතික ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී මෙම අංශයේ ප්‍රමුඛ කාර්යයන් 09 කට අදාල ක්‍රියාකාරකම් 39 ක් නිරීක්ෂණය වූ අතර ඉන් ක්‍රියාකාරකම් 25 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඇ) 1995 වර්ෂයේදී ආරම්භ කරන ලද හම්බන්තොට මීරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ වැඩිහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.19,053,095ක් වැය කිරීමෙන් පසුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2015 ජනවාරි 05 දින සිට ඉදිකිරීම් අත්හිටුවා තිබුණි. එම කොන්ත්‍රාත්කරුට විරුද්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යොමු වී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ගොඩනැගිල්ල භාවිත තත්වයට ගැනීමට හැකි ආකාරයෙන් ඉදිකිරීම් කටයුතු නිම කිරීමට ක්‍රියා කර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේදී කුච්චවේලි හෝටල් පාසලේ ආධුනිකයින් 52 දෙනෙකුට නවාතැන් ලබාදිය හැකි අංග සම්පූර්ණ කාමර 12 කින් සමන්විත දෙමහල් නේවාසිකාගර ගොඩනැගිල්ලක් රු.මිලියන 140.21 ක් වැයකර ඉදිකර තිබුණද ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම වර්ෂයේ සිට මේ දක්වාම ස්ථිර ජල සැපයුමක් ලබා ගැනීමට නොහැකි වීම නිසා ආධුනිකයන්ගේ නේවාසිකාගාරයක් ලෙස භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අමාත්‍යාංශය හා වෙනත් ආයතන මඟින් විවිධ කාර්යයන් සඳහා අධිකාරිය වෙත ලබාදී තිබුණු එකතුව රු.45,029,769 ක් වූ අරමුදල් අදාල අරමුණුගත කාර්යයන් සඳහා යොදා ගැනීමකින් තොරව බැංකු ජංගම ගිණුමක නිෂ්කාර්යව රඳවා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සම්පූර්ණ (සියයට 100ක) කොටස් අයිතිය සහිතව 2013 දෙසැම්බර් 18 දින කැබිනට් අනුමැතියක් රහිතව අධිකාරියෙ අරමුදල් වලින් VTA HOLDINGS LTD නමින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබූ සමාගම ඈවර කිරීමට අවශ්‍ය ලේඛන 2022 ජුනි 20 දින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත භාර දීමට කටයුතු කර තිබුණි. එම සමාගමේ බැංකු ගිණුම් හා මෙහෙයුම් කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරන

මගේ අංකය / எனது இல. / My No. VOT/D/VTA/1/2024/27 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි දින

ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදෙස් ලබාදී තිබුණද එම වාර්තාව 2025 අප්‍රේල් 30 දින වන විටද සකස් කර නොතිබුණි.

(උ) 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.67,216,395 ක් වූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු ශේෂය තුළ වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාලයක සිට පැවත එන රු.10,692.806 ක ශේෂ වූ අතර අධිකාරිය විසින් එම ශේෂ අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඌ) නුවරඑළිය වනරාජවත්ත ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩමෙන් රූඩ් 3 පර්චස් 31.3 ක් අධිකාරිය වෙත පවරා ගැනීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත 2018 අප්‍රේල් 25 දින රු.9,280,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා වර්ෂ 06 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද විගණිත දිනය වූ 2025 මාර්තු 28 දින වන විටත් ඉඩමෙහි අයිතිය පවරා ගැනීමට හෝ එම මුදල් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(එ) 2010 වර්ෂයේදී රු.5,823,000ක් වැයකර මිලදීගෙන තිබූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හේන්කඩුව වෙලේවත්ත පිහිටි රූඩ් 02 පර්චස් 33.5ක ඉඩම හා 2017 වර්ෂයේදී රු.34.030,346ක් වැයකර දීර්ඝකාලීන බදු පදනම මත ලබාගත් පානදුර මෝදරවිල පිහිටි අක්කර 01කින් යුත් ඉඩම 2024 වර්ෂය වන විටත් වෘත්තීය පුහුණුව සඳහා භාවිතා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඒ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාලසීමාව ඇතුලතදී සේවයෙන් ඉවත් වී තිබුණු නිලධාරීන් 54 දෙනෙකුගෙන් අධිකාරිය වෙත අයවිය යුතු රු.20,777,465ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු වාර්තාව

1.2

(අ) 2008 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් මඟින් සිදු කරන ලද ප්‍රත්‍යාගණන වටිනාකම සහ තක්සේරු නොකරන ලද ගොඩනැගිලි විස්තර සටහන් මඟින් 2008 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගිණුම් ප්‍රකාශවල නිරූපණය විය. 2008 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ගොඩනැගිලි සඳහා කරන ලද එකතු කිරීම් ගොඩනැගිලි යටතේ දක්වා ඇත.

වෘත්තිය පුහුණු අධිකාරියට අයත් නොවූ ගොඩනැගිලි වල සම්පූර්ණ තක්සේරු වටිනාකම ලද පසු ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.

වෘත්තිය පුහුණු අධිකාරියට අයත් නොවන නමුත් වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලා පවත්වන මධ්‍යස්ථාන සටහනක් මඟින් අනාවරණය කිරීමට නොහැකි විය. 2025 වර්ෂයේදී සටහනක් ලෙස ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) ඉඩම් හා ගොඩනැගිලි වත්කම් පන්තියේ මෙතෙක් තක්සේරු නොකරන ලද ඉඩම් කැබලි හය (06) තක්සේරු කිරීමට නොහැකි වී ඇත්තේ ඒවායේ පවතින අයිතිය පිළිබඳව විවිධ ගැටලු නිසාය. ඒවා නිරවුල් වූ අවස්ථාවක සියලුම වත්කම් පන්තිය නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. වාහන පන්තියට අදාළව තක්සේරු කටයුතු දැනටමත් සකස් කර ඇති බැවින් 2025 වර්ෂයේදී එම පන්තියට අදාළ වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. කෙසේ වෙතත් ආයතනය සතු දේපල පිරියත හා උපකරණ තවදුරටත් ප්‍රත්‍යාගණන අගයට පවත්වාගෙන යන්නේද පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරියේදී තීරණයක් ගැනීමට නියමිතය

(ඇ) ඔබ විසින් සඳහන් කර ඇති පරිදි දැනට ගිණුම් වලට ගෙන ඇති ඉඩම් 97 ආයතනයට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එසේම ඊට අදාළව පොදු ව්‍යාපාර කාරක සභාව විසින් අප ආයතනයට ලබා දුන් උපදෙස් අනුව ඉඩම් අයිතිය පැවරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර අධිකාරිය විසින් රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

එහෙත්, රජය සතු සහ රජයට අයත් ආයතන යටතේ පවතින ඉඩම්, සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කිරීමේදී අනුගමනය කළ යුතු පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීම, එකී ඉඩම් බැහැර කිරීමට අදාළව දැනට පවත්නා සියලු නීතිරීති හා රෙගුලාසි අධ්‍යයනය කර නව නීතිද ඇතුළුව සුදුසු සංශෝධන ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීමට ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්ගේ ප්‍රධානත්වෙයන් කමිටුවක් පත් කරනු ලැබ ඇති අතර එකී කමිටුවේ වාර්තාව අමාත්‍ය මණ්ඩලෙය් සලකා බැලීම සඳහා ඉදිරිපත් කර ඇත. එකී වාර්තාව සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් අවසන් තීරණයක් ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් නිර්දේශ පිළිබඳව සලකා බැලීම යෝග්‍ය වන බැවින් අප විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය මෙම අවස්ථාවේදී අමාත්‍ය මණ්ඩලෙය් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු නොලබන බව රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023.06.05 දිනැති ලිපිය මඟින් අධිකාරිය වෙත දැනුම් දී ඇත.

(ඈ) කදුරුවෙල මධ්‍යස්ථානය වෙත SFIG වෙතින් ලබා දී ඇති බවට උපකරණ ලැයිස්තුවක් ඉදිරිපත් කර ඇතත්, එම ලැයිස්තුව පාදක කරගෙන වත්කම් ගිණුම් ගත කළ නොහැක. ඒ සඳහා පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයෙන් එසේ ලද බවට GRN සහිතව ඒ බව සනාථ කර ඇත්තේ 1,336,965.00 වටිනා උපකරණ පමණි. තව ද එම උපකරණ ලැයිස්තුව පරික්ෂා කිරීමේ දී ඇතැම් ඒවා අලුත්වැඩියාවන් හා සවිකිරීම් බව නිරීක්ෂණය වේ. කෙසේ නමුත් පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයෙන් ලැබුණු බවට සනාථ කර ඇති රුපියල් 1,336,965.00 උපකරණ නිවැරදිව 2023 වර්ෂයේ දී ගිණුම්ගත කර ඇත.

2024 භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලදී වත්කම්වල වටිනාකම් නැවත අගය කිරීමක් ද සිදුකරන බැවින් SFIG ආයතනයෙන් ලැබී ඇති දැනට මූල්‍ය ප්‍රකාශ වල පෙන්නුම් නොකරන එම වටිනාකම් හඳුනාගෙන 2025 වර්ෂයේදී දී ගිණුම් වලට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. වෘත්තීය මාර්ගෝපදේශන අංශය වෙත ලැබී ඇති මාධ්‍ය උපකරණ සහ අහංගම හෝටල් පාසල වෙත ලැබී ඇති එම උපකරණ මෙසේ තක්සේරු කිරීමට නියමිතය. ඒ සඳහා අදාළ භාණ්ඩ සමීක්ෂණ කමිටුව වෙත උපදෙස් ලබා දී ඇත.

(ඉ) ඔබ ලිපියේ සඳහන් කරන ලද මෙම වත්කම 2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වලට වත්කමක් සේ ගෙන ඇති අතර සත්‍ය වශයෙන්ම එම වත්කම 2025 වර්ෂයේ මුල් කාර්තුව තුළ දී ආයතනයට ලැබී ඇත. කෙසේ වෙතත් 2024 වර්ෂයේදී මේ සඳහා කරන ලද රු. 4294.00 ක අධික්ෂය 2025 වර්ෂයේදී නිවැරැදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

(ඊ)

i. කෑගල්ල දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු අදායම මූල්‍ය ප්‍රකාශනය අනුව රු. 2,606,744.00 වන අතර එය නිවැරදි වේ. එය මූල්‍ය ප්‍රකාශනෙය් පෙන්නුම් කරනුයේ පහත පරිදි ය.

පූර්ණකාලින පාඨමාලා	-	2,141,719.00
අර්ධකාලින පාඨමාලා	-	202,475.00
විශේෂ කෙටිකාලින පාඨමාලා	-	262,550.00
		2,606,744.00

ii. නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට ගෙවිය යුතු උපචිත වියදම

රු 6,227,407.28 ක් ලෙස උපලේඛන පහත පරිදි වේ.

Electricity	895,660.51
Examination& Evolution	25,380.00
Janitorial Service	171,690.00
On the Job Training & Monitoring	14,500.00
Overtime	40,610.24
Part time Expenses Payable	49,14,570.00
Promotional Expenses Payable	8,400.00
Water	156,596.53
	6,227,407.28

(උ) 2024 වර්ෂයේදී පාරිතෝෂික ගෙවීම් ලෙස මූල්‍ය ප්‍රකාශ වල නිරූපණය කර ඇති රු. 54,362,375.00 යන සංඛ්‍යාව නිවැරදි වන අතර කෙසේ වෙතත්, ප්‍රතිලාභ හිමියන්ට එම මුදල් ගෙවීමේදී ඔවුන්ගේ අනුමැතිය සහිතව අඩුකර ගත යුතු රු. 3,369,178.11 ක මුදල අඩු කරෙගන ගෙවීම් කර ඇත. තවද පහත සඳහන් ගෙවීම් ප්‍රතිලාභීන් භාර නොගත් නිසා අවලංගු කර නැවත නිකුත් කර ඇති අතර එම ගෙවීම් පෙන්නුම් කරනු ලබන්නේ පාරිතෝෂික වෙන් කිරීම් ගිණුමේය.

EPF -614) එන්. ජී. එම්. ප්‍රියන්ති	490,455.00
EPF -1548) පී.බී.ජී.අයි.බී. වෑගන්තෙල්	811,720.00
EPF -1147) ඩී. කේ. උදයකුමාර	647,140.00
	1,949,315.00

(ඌ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ උපදේශක දීමනාව ලෙස ලද චෙක්පත් විස්තර මේ සමඟ ඉදිරිපත් කරන අතර එහි එකතුව රු.117,702,315.00 ක් වේ. ඒ අනුව නිවැරදි වේ.

කාර්ය සාධන දීමනාව අදාල මාසය	චෙක්පත් දිනය	චෙක්පත් අංකය	මුදල
ඔක්තොම්බර් 2023	12/31/2023	391343	9,157,274.25
නොවැම්බර්	2/13/2024	391700	9,573,475.00
දෙසැම්බර්	2024/2/19 , 2024/2/28	391885/391724	9,793,283.25
ජනවාරි 2024	4/10/2024	392115	9,214,470.00
පෙබරවාරි	6/3/2024	392537	9,259,455.00
මාර්තු	7/3/2024	392723	9,276,335.00
අප්‍රේල්	9/6/2024	393149	9,034,030.00
මැයි	9/6/2024	393147	8,693,682.50
ජූනි	9/6/2024	393153	8,764,785.00
ජූලි	10/7/2024	547676	8,826,922.50
අගෝස්තු	10/7/2024	547677	8,644,325.00
සැප්තැම්බර්	10/24/2024	548058	8,720,940.00
ඔක්තොම්බර්	11/28/2024	578492	8,743,337.50
මුළු මුදල			117,702,315.00

(එ) ඔරුගොඩවත්ත K -Tec ආයතනෙය් පවත්වාගෙන යනු ලැබූ Industrial Management පාඨමාලාව 2023 ඔක්තොම්බර් මස ආරම්භ කර තිබූ අතර ඒ සඳහා පාඨමාලා ගාස්තු වලින් රු. 500,000.00 ක් යුධ හමුදාව මගින් 2023 ඔක්තොම්බර් මාසය තුළදී ගෙවීම් කරන ලදී. ඉතිරි මුදල වන රු. 539,975.00 ක් 2024.06.30 දින ලැබුණි. නමුත් 2023 වර්ෂයේදී ලැබිය යුතු හිඟ ආදායම් ලෙස රු. 539,975.00 ක මුදල ගිණුම් වල නිරූපණය නොවුණු බැවින් ලැබිය යුතු ආදායම් යටතේ ගැලපීමට නොහැකි විය. ලැබිය යුතු පාඨමාලා ගාස්තු නිවැරදිව ගිණුම් වල සටහන් කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත.

(ඒ) අපගේ තොරතුරු අනුව 2024.12.31 දිනට මෙවැනි හිඟ කඩකුලී මුදලක් ගෙවිය යුතු බවට නිරූපණය නොවේ. තවද අප ආයතනය විසින් පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව සමඟ ඇති කර ගන්නා ලද ගිවිසුම අනුව නිසි පරිදි ගෙවීම් කර ඇත. වැඩිදුරටත් මෙම ස්ථානය නාය යෑමට භාජනය වීමේ අවධානමක් පවතින හෙයින් එම ස්ථානෙයන් ඉවත් වන බව 2022.02.17 වන දින පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුම් දී ඇත.

2.2.2

(අ) i. මු.රේ. 257 සහතික කළ වවුචර් සඳහා පමණක් ගෙවීම් කළ යුතුවීම.

විමසුමේ සඳහන් මෙම අඩුපාඩුව ඉදිරියේදී සිදු නොවන අතර දිස්ත්‍රික් භාර සියලුම මූල්‍ය නිලධාරීන්ට මේ පිළිබඳව උපදෙස් ලබා දී ඇත. ඒ අනුව ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවනු ඇත.

මු.රේ. 272 ගෙවූ වවුචර් භාරය

මුදල් අංශය විසින් වාර්ෂිකව සිදු කරනු ලබන සෑම ගනුදෙනුවකටම අදාළව ඉදිරිපත් කරනු ලබන සෑම වවුචරයක්ම අනුක්‍රමික අංක පිළිවෙලට මාසිකව වෙන වෙනම ආරක්ෂිතව ගබඩා කිරීමටත් අවශ්‍ය අවස්ථාවන්හී දී විගණනය සඳහා ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය සියළුම උපදෙස් මූල්‍ය නිලධාරීන් වෙත ලබා දීමට කටයුතු කර ඇත.

මු.රේ. 322 සුරක්ෂිත භාරයේ තබා ඇති ද්‍රව්‍ය හරි වැරදි බැලීම සඳහා සෑම විටම තිබිය යුතු බව

ප්‍රධාන කායර්ාලය සහ දිස්ත්‍රික් ජාතික මධ්‍යස්ථාන වල මුදල් අංශයට අදාළ සුළු මුදල් මුද්දර හා අග්‍රිමයන්ට අදාළව දෛනික ශේෂ තහවුරුවක් දැනටමත් ලබා ගැනීම සිදුවන අතර ඒ පිළිබඳව නැවත නැවතත් මෙම විමසුමේ සඳහන් පරිදි ක්‍රියා කිරීමට අවශ්‍ය උපෙදස් ලබා දීම හා එහි ප්‍රගතිය විමසා බැලීමට ද කටයුතු කරමි.

ii. දිස්ත්‍රික් කාර්යාල වලින් දැනටමත් ධාවන සටහන් ලබාගෙන ඇති අතර මේ වන විටත් ලැබී ඇති ධාවන සටහන් විගණනය වෙත යොමු කර ඇත.

(ආ) මෙහි සඳහන් අවස්ථා 03 හිම ලබා දී ඇති අත්තිකාරම් චෙක්පත් මගින් පමණක් ලබා දී ඇති අතර සහ අදාළ ආයතන වෙත ලබාදීමට කටයුතු කර ඇති අතර මෙවැනි අත්තිකාරමක් ලබාදීමට හේතුව වූයේ අදාළ සේවාවන් ලබාගැනීමට පෙර එම මුදල් ගෙවිය යුතු බව කොන්දේසියක් ලෙස එම ආයතන සඳහන් කර ඇති නිසාය.

i. යු.ජේ.පී ප්‍රියදර්ශන - ධාවන සටහන් පොත් රු.108,410.00 මිලදී ගැනීම.

අධිකාරිය විසින් අත්තිකාරම් දෙනු ලබන්නේ මාණ්ඩලික නිලධාරියකුට පමණි. ඉහත දී ඇති අත්තිකාරම් යු.ජේ.පී ප්‍රියදර්ශන මහතාට ලබා දුන් මුදල් අත්තිකාරම් නොවන අතර අත්තිකාරම් භාරව සිටින නිලධාරියා වන අතර එය ආදායකයාගේ ගිණුමට පමණක් ගණුදෙණු කල නොහැක යන විශේෂිත රේඛිත චෙක්පතකින් ධාවන සටහන් ලබා ගැනීම උදෙසා රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුවට නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ක්‍රියා කරමින් ලබා දුන් ආයතනික ගෙවීමකි.

එසේම රජයේ මුද්‍රණ දෙපාතර්මේන්තුව විසින් මෙම සැපයුම ලබා දෙන්නේ මුදල් ගෙවීම් කළෙහොත් පමණි. එබැවින් මෙම අත්තිකාරම් ඔවුන්ගේ ඉල්ලීම මත ගෙවන ලදී.

ii. එල්.පී.කේ.වැලිවත්ත - නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතනෙය් වැඩ ගොඩනැගිලි විදුලි පද්ධතිය අලුත් වැඩියා කිරීම

මෙම ගෙවීමද අත්තිකාරම් භාරව කටයුතු කරන නිලධාරි වශෙයන් ඉහත නිලධාරියා කටයුතු කලද මෙම ගෙවීම සිදුකර ඇත්තේද නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අදාළ අනුමැතිය මත ACL Cables PLC ආයතනයට විශේෂිත රේඛීය චෙක්පතකින් ගෙවන ලද්දකි. භාණ්ඩ සැපයීමට ප්‍රථමව ගෙවීම් කල

යුතුය යන කොන්දේසියක් එම ආයතනය දක්වා ඇති පසුබිමක මෙම ද්‍රව්‍ය ඉතා ඉක්මනින් ගත යුතු බැවින් මෙම ගෙවීම් කර භාණ්ඩ ලබා ගෙන අත්තිකාරම විධිමත්ව පියවා ඇත.

iii. ආර්. අබේගුණසේකර - ලොරි රථ 02 ක් සඳහා අවශ්‍ය වැසි ආවරණ කට්ටල මිලදී ගැනීම

මෙම ගෙවීමද අත්තිකාරම් භාරව කටයුතු කරන ලද නිලධාරියාට රු 101,480.00 මුදල් ලබා දී නොමැති අතර නිසි අනුමැතිය මත අදාළ ආයතනයේ ණය පහසුකම් ලබා නොදෙන නිසාත් (අදාළ ලිපිය අමුණා ඇත. ඇමුණුම 01) ආයතනික අත්තිකාරමත් ලෙස චෙක්පතකින් V V Enterperises වෙත නිකුත් කරන ලද්දකි. මේ සඳහා නිසි අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව මෙම අත්තිකාරම් සියල්ල අධිකාරියේ නිලධාරීන් සඳහා ලබා දුන් අත්‍යාවශ්‍ය කාර්යයන් ඉටු කිරීම සඳහා ආයතන වෙත ලබා දුන් අත්තිකාරම් පමණක්ම බවත් සඳහන් කරන අතර අදාළ නිලධාරියාගේ නම සඳහන් කරනුයේ අත්තිකාරමට අදාළ බිල්පත් ගෙන්වා ගැනීමට ඔහු හෝ ඇය වගකීමකට බැඳී තිබීමක් අවශ්‍ය වන බැවිනි. ඉදිරියේදී අත්‍යාවශ්‍ය භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමට ආයතන වෙත අත්තිකාරම් ලබා දීමට සිදු වනු ඇත. මේ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර උපදෙස් ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

(ඇ) මෙම තනතුරු ද ඇතුළත්ව අධිකාරියේ පුරප්පාඩු තනතුරු 623 ක් බඳවා ගැනීමට සහ ජ්‍යෙෂ්ඨ උපදේශක තනතුරු 75 ක් සඳහා අභ්‍යන්තර උසස්වීම් මඟින් බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලැබී ඇත. ඒ අනුව විධිමත් පරිදි නව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

2.2.4

(අ) ප්‍රධාන ගබඩාවට ලැබුණු මෙම යතුරුපැදි සඳහා 2024.05.28 දින GRN නිකුත් කර ඇත. එම යතුරුපැදි වෙනුවෙන් බෙදාහැරීමේ ලේඛන 2024.06.04 දින ලැබී තිබෙන අතර 2024.06.25 දින හුණුපිටිය මධ්‍යස්ථානය වෙත ලබා දී තිබේ. යතුරුපැදි ගබඩාවට ලද පසු නැවත වරක් තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් පිරිවිතර අනුව පරීක්ෂා කිරීමටත් යතුරුපැදි බෙදාහැරීම් කටයුතු වලදී ප්‍රවාහනයේදී සැලකිය යුතු කාලයක් ගත වී ඇති බවත් පිළිගනිමි. ඉදිරියේදී මේ පිළිබඳව වඩාත් සැලකිලිමත්ව කටයුතු කිරීමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කරමි.

(ආ) මෙම පාඨමාලාව සඳහා medical dummy ක් අවශ්‍ය වන බැවින් ඊට අදාළව ආයතනය විසින් (Yaashwa International) මිල ගණන් ඉදිරිපත් කර ඇත. එලෙසම පිරිවිතර ලබා දෙන අවස්ථාවේදී 2023 වර්ෂයේ මෙම උපකරණයේ තිබූ මිල ගණන් ඉදිරිපත් කර ඇත. නමුත් පසුව වෛද්‍ය උපකරණ වල මිල ඉහළ යාම නිසා (Dollar ඒකකයක මිල හා Tax ඉහළ ගිය බැවින්) වතර්මානයේ මෙම උපකරණයේ මිල Yaashwa International ආයතනය ඉදිරිපත් කර ඇති රු. 440,000/= මුදල එය වර්තමාන වෙළඳපල වටිනාකම් බව තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් සනාථ කර ඇත.

2.3

(අ) අධිකාරියට උපදේශක කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමත්, ඔවුන්ගේ කාර්ය සාධනය සැලකිල්ලට ගෙන ඔවුන් ස්ථිර උපදේශක තනතුරට පත් කිරීමත්, දීර්ඝ කාලයක සිට මෙම අධිකාරියේ අනුගමනය කර ඇති ක්‍රියාපිළිවෙත වී තිබිණි.

තවද, අදාල ක්ෂේත්‍රයේ පාඨමාලාවල පවත්වාගෙන යාම ඵලදායි වන්නේද යන්න හා උපදේශකවරුන්ගේ සතුටුදායක කාර්යය සාධනය මත ඔවුන්ට නැවත කොන්ත්‍රාත්තුව ලබා දීම සිදුකරනු ලැබේ.

එසේම පාඨමාලාව තවදුරටත් අවශ්‍ය නොවන්නේ නම් හෝ ඉතා දුවර්ල කාර්යය සාධනයක් පවතින්නේ නම් අදාළ උපදේශකවරයාගේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට පියවර ගනු ලැබේ.

කොන්ත්‍රාත් පදනම මත දැනට සේවය කරන උපදේශකවරුන්ගෙන් පිරිසක් අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වීමට පෙර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ අය වේ. එසේම, ඉන් පසුවද ඇතැම් ක්ෂේත්‍රවල NVQ 5 මට්ටෙම් සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉතාමත් සීමිත වූ බැවින්, NVQ 4 සමඟ අදාළ ක්ෂේත්‍රයේ පලපුරුද්ද සැලකිල්ලට ගෙන කොන්ත්‍රාත් පදනමින් සේවා අවශ්‍යතාවය මත බඳවා ගැනීම් සිදු කර ඇත.

උපදේශකවරුන් බඳවා ගැනීමේදී අනිවාර්යයෙන්ම එක් එක් පාඨමාලාවට යෝග්‍ය වන ආකාරයට බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර අදාළ බඳවාගැනීම් පටිපාටියේ දක්වා ඇති සුදුසුකම් ඇති අය තෝරා ගැනීම දුෂ්කර කාර්යයක් වේ. තවද එම තනතුරු සඳහා නියමිත ගෙවීම් වලට අදාළ සුදුසුකම් සහිත අය බඳවා ගැනීමේදී ද දුෂ්කරතා ඇත. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් පසු ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් කර නිසි පරිදි ස්ථිර කිරීමට පියවර ගන්නා නමුත් ඇතැම් අය අදාළ සාධන මට්ටමට ළඟා වීමට නොහැකි වන්නේ නම් එවන් අය ස්ථිර කිරීමට හැකියාවක් නැත.

(ආ)

2024 ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික කාර්යය සාධනය ඉලක්ක කරගත් ප්‍රමුඛ කාර්යයන් 09ක් හඳුනාගෙන තිබුණි. (ඇමුණුම 02) එම එක් එක් ප්‍රමුඛ කාර්යයන්ට අදාළ අනුකාර්යයන්ද හඳුනාගෙන තිබුණි.

ඒ අනුව ඉලක්කගත කරන ලද ක්‍රියාකාරකම් පහක 50% ක අඩු කාර්යය සාධනයක් පෙන්නුම් කරන අතර ඒ සඳහා පහත හේතුන් බලපා ඇත.

1. වෘත්තීය මාර්ගෝපදේශන ප්‍රමුඛ කාර්යය සඳහා හඳුනාගත් අනුකාර්යයන් දෙකෙහි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය 40% කි.

වෘත්තීය පුහුණුව ලබන ආධුනිකයින් අතුරින් හදාරනු ලබන පාඨමාලාවන් අනුව ව්‍යවසායකයින් ලෙස කටයුතු කිරීමේ විභවතාවයක් ඇති ආධුනිකයින් උදෙසා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ඉලක්ක කරනු ලබයි. මෙම වැඩසටහන්හි ඉලක්කගත වැඩසටහන් කරා ළඟා වීමට නොහැකි වීමට බලපා ඇත්තේ මෙම පුහුණුව ලබන්නන් වෙත ලබා දෙනු ලබන SEPI ණය යෝජනා ක්‍රමය පසුගිය වසර තුනක කාලයක සිට අක්‍රිය වීමය. (රේඛීය අමාත්‍යාංශය විසින් මහ බැංකුව හරහා මේ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබයි.)

2. ප්‍රමුඛ කාර්යයන්හි අංක 04 ට අයත් අනු කාර්යයක් වන Course Inclusion අවස්ථානුකූලව ඉලක්කගත කරන කාර්යයක් වන බැවින් 2024 වසර තුළ අවශ්‍යතාවයන් පැන නැගී නොමැති බැවින් ප්‍රගතියක් පෙන්නුම් කළ නොහැක.

3. 5 වන ප්‍රමුඛ කාර්යයයේ සමස්ත රැකියාගත කිරීම් ප්‍රගතිය 100% ක් වුවද අනුකාර්යයක් වන වක්‍ර රැකියාගත කිරීමේ ප්‍රගතිය ඉතා අඩු කාර්යය සාධනයක් පෙන්නුම් කරයි.

මෙම ඉලක්කය සකසා ඇත්තේ හදාරනු ලබන පාඨමාලාවටම අදාළ රැකියා ගත කිරීමක් සිදු නොවන නමුත් හදාරනු ලබන පාඨමාලාව රැකියා අවස්ථාවක් සඳහා සෘජුවම බල නොපෑවද රැකියාවක් සඳහා අමතර සුදුසුකමක් සපුරා ගැනීමක් වන (තොරතුරු තාක්ෂණ පාඨමාලාවන්හි) ආධුනිකයින් ඉලක්ක කරමිනි. ඒ අනුව 2024 වෂර්යේ දී පුහුණුලාභීන් හැදෑරූ පාඨමාලාව පදනම්ව ආධුනිකයින් වැඩි පිරිසක් හදාරන ලද පාඨමාලා පදනම්ව රැකියාගත වී ඇති බැවින් වක්‍ර රැකියා ප්‍රගතිය අඩු අගයක් ගෙන ඇත. එය සෘජු රැකියා ගත කිරීම් ඉලක්කය ඉක්මවා වාතර්‍ා වීම මඟින්ද පෙන්නුම් කරයි.

රැකියා වෙළඳපල ප්‍රගතිය 46% ක් වී ඇත. ඔරුගොඩවත්ත ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ පුද්ගලික අංශයේ විශාල රැකියා ආයතන සහ විදේශ රැකියා නියෝජිත ආයතන ඇතුලත් 60 කට අධික ප්‍රමාණයක් කැඳවා මහා පරිමාණයේ රැකියා වෙළඳපොලක් පැවැත්වීමට කටයුතු කළ බැවින් හා ප්‍රාදේශීයව සුළු පරිමාණ කර්මාන්තයන් පැවැතිම මත රැකියා වෙළඳපල පැවැත්වීමට කටයුතු නොකරන ලදී. ඉදිරියේදී දිස්ත්‍රික් මට්ටමින් නොව පළාත් මට්ටමින් රැකියා වෙළඳපල පැවැත්වීමට සැලසුම් කර ඇත.

4. 8 වන ප්‍රමුඛ කාර්යය වන කර්මාන්ත සබඳතා යටතේ කර්මාන්ත දැනුවත් කිරීමේ ප්‍රගතිය 41% කි. මෙම වැඩසටහන මඟින් කර්මාන්ත හිමියන් ගෙන්වා ආධුනිකයින් වැඩිදුර පුහුණුවට යොමු කිරීම මෙන්ම රැකියාගත කිරීම පිළිබඳව දෙමාපියන් හා ආධුනිකයින් දැනුවත් කර, ඒ සඳහා අභිප්‍රේරණයක් සිදු කරනු ලැබේ. කර්මාන්ත හිමියන් ගෙන්වා ගැනීම මෙන්ම ප්‍රාදේශීයව සුළු පරිමාණ කර්මාන්ත බහුලව පැවැතීම මත රැකියා අවස්ථා අඩුවීම හේතුවෙන් වැඩසටහන් සංවිධානය වී නොමැත. මෙම ප්‍රායෝගික ගැටලු අවම කර ගනිමින් උපායමාර්ගිකව ඉදිරියේදී කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

5. 9 වන ප්‍රමුඛ කරුණ යටතේ සෙවුම් අධ්‍යනයන් හා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කරනු ලබයි.

සෙවුම් අධ්‍යයනයන් දෙකක් ඉලක්ක කළද පර්යේෂණ කාර්යය සඳහා එක් පර්යේෂණ නිලධාරිනියක් පමණක් වීම මත සෙවුම් අධ්‍යයන යෝජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එසේ වුවද ආයතනික අවශ්‍යතාවයන් මත ශක්‍යතා අධ්‍යයනයන් 10 ක් සිදු කර ඇත. එසේම පර්යේෂණ කාර්යය සඳහා කාර්යය මණ්ඩලය බඳවා ගැනීමෙන්/ අනුයුක්ත කිරීමෙන් ක්‍රමවත් වනු ඇත.

(ඇ)

- මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ දෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2015.01.05 දින අත්හිටුවීම දැනුම් දීමෙන් පසු කොන්ත්‍රාත් ආයතනය සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

  1. කොන්ත්‍රාත්කරුගේ කාර්යය සාධන බැඳුම්කරය මුදල් බවට පත්කර 2015.02.02 දින රු.2,130,677.83 ක මුදලක් අධිකාරියේ ගිණුමෙහි තැන්පත් කර ඇත.
  2. අවසන් ගෙවීම් සිදුකිරීමේදී ප්‍රමාද අලාභ ගාස්තු ලෙස රු.2,505,549.00 ක මුදලක් අඩුකර ඇත.
  3. කොන්ත්‍රාත් ආයතනය අයත් වැඩබිමෙහි තිබූ ද්‍රව්‍ය හා උපකරණ අධිකාරිය භාරයේ රඳවා ගෙන ඇත.

4. කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2022.04.06 දින කොන්ත්‍රාත් ආයතනය පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන මෙහෙයුම් ඒකකය වෙත දන්වා ඇත.

- ඉදිකිරීම් කටයුතු අතර මැද නවතා දැමූ මෙම ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් කටයුතු සිදුකර ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

2016 වසරේ නැවත ටෙන්ඩර් කැඳවා ඉදිකිරීම් කටයුතු කිරීමට තැත් කිරීම.

2016.04.08 - පුවත්පත් දැන්වීම.

2016.05.08 - ලංසු විවෘත කිරීම.

2016.05.27 - තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබාදීම.

2016.10.27 - ප්‍රසම්පාදන වාර්තාව ලබාදීම. (කොන්ත්‍රාත් ප්‍රදානයට අනුමැතිය ලබා නොදෙන ලදී)

1. 2018 වසරේ නැවත මේ සඳහා ඉල්ලීම් කළ ද ඒ සඳහා ප්‍රතිපාදන නොලැබුණි.

2. 2020 දී ආංශික නිපුණතා හා සංවර්ධන වැඩසටහන යටතේ ඉටුකිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළද, කොරෝනා වසංගත තත්ත්වය නිසා 2020 වසර තුළ ඉටුකළ නොහැකි විය.

3. නැවත 2022 වසරේ අමාත්‍යාංශ අතිරේක ප්‍රතිපාදන වලින් ඉතිරි ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත.

4. 2016 වසරේ සිට මෙම ගොඩනැගිල්ල අව්, වැසි, සුළං ආදී කාලගුණික තත්ත්වයනට සෘජුවම නිරාවරණය වී තිබීම හේතුවෙන් මෙහි ව්‍යුහාත්මක තත්ත්වය පිළිබඳව සුදුසුකම් ලත් ආයතනයකින් නිවැරදි තත්ත්ව වාර්තාවක් ලබාගෙන ඒ අනුව ඉදිරි කටයුතු කරන ලෙසත් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට අදාළ වූ කටයුතු නිසි පරිදි නිමකරන ලෙසත්, අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ රැස්වීමේදී උපදෙස් ලබා දෙන ලදී.

5. ඉහත උපෙදස් පරිදි 2022.03.29 දින අප අමාත්‍යාංශයේම ආයතනයක් වන ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ (NERD Centre) අධ්‍යක්ෂ ජනරාල් අමතා කරන ලද ඉල්ලීම පරිදි 2022.10.01 දින එම ආයතනය විසින් මේ පිළිබඳව මූලික වාර්තාවක් ලබා දී ඇත.

6. එම වාර්තාව අනුව මෙම ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක පරීක්ෂණයක් සිදුකර සවිස්තර වාර්තාවක් පරමාණු බලශක්ති මණ්ඩලයේ සහාය ඇතිව ඉටුකළ යුතු බව දන්වා තිබූ හෙයින් එම මණ්ඩලයේද සහාය ලබාගෙන එම කාර්යය ඉටුකර දෙන ලෙස 2022.07.11 දින සහ 2022.10.04, 2023.08.09 ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයෙන් ඉල්ලීම් කරන ලදී.

7. මේ අතර මෙම ව්‍යාපෘතිය අත්හිටුවන අවස්ථාවේ කොන්ත්‍රාත් ආයතනයට අයත් ද්‍රව්‍ය හා උපකරණ මෙම භූමියේ රඳවා තබාගෙන ඇති බැවින් මේ පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා පත්කරන ලද විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවේද නිර්දේශ වූයේ NERD ආයතනය හා පරමාණු බලශක්ති මණ්ඩලයේ පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව මෙම ගොඩනැගිල්ල සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවයි.

8. අධිකාරිය විසින් දිගින් දිගට ඉල්ලීම් කළද, NERD ආයතනයෙන් ඒ සඳහා පිළිතුරු නොලැබුණු හෙයින් ඒ හා සමානව මෙවැනි සේවා සපයන රාජ්‍ය ආයතනයක් වූ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) වෙතින් මෙම ගොඩනැගිල්ල පරීක්ෂා කර ව්‍යුහාත්මක ස්ථිතීතාවය පිළිබව තත්ත්ව වාර්තාවක් ලබාදීමට කටයුතු කරන ලෙස 2023.10.12 දිනැතිව ලිපියෙන් ඉල්ලුම් කරන ලදී.

9. ඒ අනුව, 2024.02.26 දින ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) විසින් මූලික පරීක්ෂාව සිදුකරන ලදී.

10. ඉන්පසු 2024.04.08 දින ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) විසින් අවසාන පරීක්ෂාව සිදුකර 2024.12.26 දිනැති වාර්තාව අධිකාරිය වෙත ලබා දී ඇත.

11. එම වාර්තාව ඉහත පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදුව 2025.02.05 දින එම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නැවත ගොඩනැගිල්ල භෞතිකව පරීක්ෂා කර තම නිර්දේශයන් සහිත වාර්තාව අධිකාරිය වෙත ලබා දී ඇත.

12. එම වාර්තාව අනුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) විසින් මෙම ගොඩනැගිල්ල භාවිතයට ගතහැකි මට්ටමට පිළිසකර කිරීම සඳහා නිර්දේශිත කාර්යයන්ද ඇතුළත් කරමින් මෙම ගොඩනැගිල්ලේ උඩුමහල ඉදිකර වහලය ඉදිකිරීම සඳහා 2025 වසරේ අප අමාත්‍යාංශයේ පුහුණු මධ්‍යස්ථානවල භෞතික සම්පත් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇස්තමේන්තුද ඉදිරිපත් කර ඇත. එම ප්‍රතිපාදන ලද පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර මෙම ඉදිකිරීම් සිදුකිරීමට කටයුතු කරමි.

(ඈ) කුච්චවේලි හොටෙල් පාසල ආරම්භ කරන අවස්ථාවේ ස්ථිර ජල සැපයුමක් නොමැති බව හඳුනාගෙන තිබූ අතර ජල සම්පාදන හා ජලප්‍රවහන මණ්ඩලය මඟින් ස්ථිර ජල සැපයුමක් ලබා දෙන තෙක් බවුසර් මඟින් මධ්‍යස්ථානයට අවශ්‍ය ජල පහසුකම් ලබා දීමේ එකඟතාවය මත මෙම මධ්‍යස්ථානය ආරම්භ කර ඇත.

මේ වන විට ස්ථිර ජල සැපයුමක් ලබාගැනීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලප්‍රවහන මණ්ඩලෙයන් 2024.07.15 දින, එම මණ්ඩලෙයේ ත්‍රිකුණාමල ශාඛා කාර්යාලය වෙතින් ඉල්ලීමක් කරන ලදි. ඒ අනුව එම ආයතනය පැමිණ පරීක්ෂා කර බලා මේ සඳහා ඇස්තමේන්තුවක් ලබාදෙන ලදි.

එම ඇස්තමේන්තුව පරිදි මෙම කාර්යය සඳහා ජාතික ජලසම්පාදන මණ්ඩලයට සියලු බදු සමඟ රු. 3,517,400.00 ක මුදලක් ද, මාර්ග සංවර්ධන අධිකාරියට සියළු බදු ඇතුළත්ව රු. 100,322,62 ක මුදලක් ගෙවා ඇත. ඒ අනුව මෙම ආයතනය විසින් කුච්චවෙලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වෙත ජල සැපයුම ලබා දෙනු ඇත. ඉන් පසු සැලසුම් කළ පරිදි 2025 වසෙර් සිට මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ හැකි වේ.

(ඉ) අමාත්‍යාංශය හා වෙනත් ආයතන මඟින් විවිධ කාර්යයන් සඳහා වර්ෂ 2019 සිට 2024 දක්වා අධිකාරිය වෙත ලබා දී තිබූ ආධාර හා මුදල් ශේෂය රු. 45,029,770.16 ක් විය. විස්තර පහත පරිදි වේ.

ආයතන	2024/12/31
මුල් ළමාවිය සංවර්ධනය	2,947,482.86
13 වසරක අඛණ්ඩ වැඩසටහන්	18,352,367.66
S4IG	4,490,026
නිපුණතා සිසු සවිය	7,888,000
නියාගම ව්‍යාපෘතිය	11,296,964.33
අමාත්‍යාංශය	74,929.04
එකතුව	45,029,770.16

1. (ඊ) මුල් ළමා විය සංවධනර්ය (ලෝක බැංකුව ආධාර යටතේ) රු.2,947,482.86

ලෝක බැංකු ආධාර යටතේ මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2019 ජූනි මාසෙය් සිට ළමා සුරැකුම් පාඨමාලාවල පුහුණුව ලබන ආධුනිකයින්ගේ පුහුණු කටයුතු සඳහා එක් අයකුට රු.50,000.00 ක මුදලක් බැගින් වැය වන ආකාරයට මුදල් ලබා දීමට එකඟ විය. එම මුදලින් පාඨමාලාව පවත්වා ගෙන යනු ලබන දිස්ත්‍රික් කාර්යාල හා ජාතික මධ්‍යස්ථානවල පන්ති කාමර වැඩි දියුණු කිරීම හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම අරමුණු කර ඒ අනුව කටයුතු කරන ලදී.

නමුත් එසේ ලබා දුන් ආධාර මුදලින් මේ වන විට රු.2,947,482.86 ක මුදලක් ඉතිරි වී ඇත. එම මුදලින් උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කළද, අදාළ උපකරණ සඳහා සාම්පල් පරීක්ෂාවේදී පිරිවිතරයන්ට නොගැළපීම නිසා හා ඉහළ මිල ගණන් ඉදිරිපත් වීම මත භාණ්ඩ මිලදී ගැනීමට නොහැකි විය. තව දුරටත් මෙම මුදල ඉතිරිව තිබෙන අතර ඉදිරියේදී උපකරණ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ඇත.

2. අමාත්‍යාංශ යටතේ ලැබී (13 වසරක අඛණ්ඩ වැඩසටහන්) ප්‍රතිපාදන රු. 18,352,367.66

මෙම මුදල සඳහා මේ වන විට මිල ගණන් කැඳවා ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2025 වර්ෂයේදී මෙම මුදල නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.

3. S4IG රු. 4,490,026.00

උපදේශකවරුන් 4 දෙනෙකු සඳහා වන වැටුප් ගෙවීමට හා පරිපාලන වියදම් වෙනුවෙන් වෙන් කරන ලද මුදලකි. උපදේශකවරුන් සඳහා වන වැටුප් ගෙවීම මාසිකව මෙම අරමුදලින් ගෙවීම සිදු කරනු ලබයි.

4. නිපුණතා සිසුසවිය රු.7,888,000.00

නිපුණතා සිසු සවිය යනු තෝරාගත් අඩු ආදායම්ලාභි ආධුනිකයන්ගේ නිර්ණායකයන් මත පදනම්ව කරනු ලබන ගෙවීමකි. මධ්‍යස්ථානයන්හි ඉගෙනුම ලබන ආධුනිකයන්ගෙන් නිපුණතා සිසුසවිය සඳහා හිමිකම් ලබන ආධුනිකයන්ගේ විස්තර ප්‍රධාන කාර්යාලය විසින් ලබා ගනු ලබයි. එම නාම ලේඛනය මත පදනම්ව අවශ්‍ය අක්මුදල් අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කරනු ලබයි. එම මුදල අදාළ දිස්ත්‍රික්කයන් හා ජාතික මධ්‍යස්ථාන වෙත ලබා දීම සිදු කරනු ලැබුවද, ගෙවීම් කිරීමේදී අදාළ නිර්ණායකයක් වූ 80% පැමිණීම සම්පූර්ණ නොකළ ආධුනිකයන් වෙත ගෙවීම් සිදු නොවේ. එම නොගෙවූ මුදල පසුව ලබා දෙන වාරිකයේදී අඩුකර ලබා දීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව 2025 ජනවාරි සිට මාර්තු දක්වා ගෙවීම් කර ඇත.

5. නියාගම ව්‍යාපෘතිය රු. 11,296,964.33

මෙම ව්‍යාපෘතියට අදාළ වියදම් තවදුරටත් සිදුවෙමින් පවතින අතර 2025 වර්ෂයේදී එම වියදම් අවසන් වනු ඇත.

6. අමාත්‍යාංශය රු. 74,929.04

අමාත්‍යාංශය යටතේ සිදු කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් අමාත්‍යාංශයෙන් VAT බදු සඳහා ලද මුදලකි. මෙම මුදල නැවත අමාත්‍යාංශය වෙත යැවීම හෝ අදාළ කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම 2025 වර්ෂයේදී සිදු කරනු ඇත.

(ඊ) VTA/LO/VTA/Holding Pvt Ltd ඈවර කිරීම හෝ සමාගම් නාමලේඛනයෙන් නම කපාහැරීම සඳහා මූලික විමසුම් කටයුතු වලදී අපවෙත අනාවරණය වූ ප්‍රධානම කරුණ වන්නේ 2013 වර්ෂයෙන් පසුව එම සමාගම විසින් ගොනුගත කළ යුතු කිසිදු ලේඛනයක් සමාගම් රෙජිස්ටාර්වරයාට ඉදිරිපත් කර නොමැති බවයි. මෙම කරුණ අනාවරණය වූයේ අදාළ සමාගම පිළිබඳව අප විසින් සමාගම් රෙජිස්ටාර් දෙපාතර්මේන්තුවේ ලේඛන පරීක්ෂා කිරීම් තුළිනි. දැනට අප සතුව පවතින්නේ මෙම සමාගමේ 2014 වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන පමණි. ඉන් පසුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති ද ඒවා විගණනය කර ඇති ද පිළිබඳව හෝ 2014 වර්ෂයට පසු එම සමාගම විසින් සකස් කරන ලද ගණුදෙනු වේ නම් ඒ පිළිබඳව දත්තයන්ද ලබා ගැනීමට හැකියාවක් නැත. මේ කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කිරීමෙන් අනතුරුව මේ පිළිබඳව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නීතිපති දෙපාතර්මේන්තුවෙන් විමසීමක් කර ඇත.

(උ) 2024 දෙසැම්බර් 31 දිනට අධිකාරිය වෙතට ලැබිය යුතු පාඨමාලා ගාස්තු ශේෂයෙන් රු.10,692,806.00 ක් වූ ශේෂය වර්ෂ 01 සිට 05 ක කාලයක සිට පැවත එන ශේෂයක් වේ.

2019 වර්ෂයේ අම්පාර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ හා දෙහිඅත්තකණ්ඩිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ කොරියන් භාෂා පාඨමාලාව සඳහා අධුනිකයින්ගෙන් අයවිය යුතු පාඨමාලා ගාස්තු පිළිවෙලින් රු.124,650.00 ක් හා රු.123,250.00 ට ක් අයවිය යුතුව ඇත. එසේම 2020 වර්ෂයේදී අම්පාර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ අයවිය යුතු පාඨමාලා ගාස්තුව රු.841,650.00 කි. එම පාඨමාලාවන් අතරමඟදී නැවතීම මත තව දුරටත් අයවිය යුතු පාඨමාලා ගාස්තු වශයෙන් අවසාන ගිණුම් වල පෙන්නුම් කෙරේ.

2019 හා 2020 වර්ෂයන්හිදී වෘත්තීය පුහුණු අධිකාරිය කොරියන් ආයතනයක් හා එක්ව කොරියන් භාෂාව ඉගැන්වීම් වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කර එම ගිවිසුම අනුව පාඨමාලා වෙනුවෙන් පාඨමාලා ගාස්තු ගෙවීමට එකඟ විය. නමුත් 2020 මාර්තු මාසයේදී වූ කොවිඩ් තත්ත්වය නිසා පාඨමාලා අතරමඟදී නවත්වා දමන ලදී. නැවතත් එම පාඨමාලා ආරම්භ කිරීම සිදු නොවීය. 2019 වසරේදී ආධුනිකයින් 48 ක් ද 2020 වර්ෂයේදී සිසුන් 119 ක් ද විය.

ඒ අනුව අම්පාර වෘත්තීය පුහුණු ආයතන හා දෙහිඅත්තකන්ඩිය වෘත්තීය පුහුණු ආයතනයෙන් අයවිය යුතු රු.1,089,550.00 මුදල තවදුරටත් අය වීමට ක්‍රියා මාගර්යක් නොමැති බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහ විගණන කළමනාකරණ කමිටුව වෙත යොමු කර ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි.

2021 හා 2022 යන වර්ෂවල ලැබිය යුතු පාඨමාලා ගාස්තු 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල් වන අතර එම මුදල අමාත්‍යාංශයෙන් ලබා දෙන බව ප්‍රකාශ කර ඇත. තවද 2023 හා 2024 වර්ෂවල ලැබිය යුතු පාඨමාලා ගාස්තුවලින් මිලියන 15.4 ක් මේ වන විට ලැබී ඇති අතර ඉතිරි මුදල අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

(ඌ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ වනරාජාවත්ත ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු බව 2013.09.17, 2016.01.12 සහ 2017.08.05 දිනැති ලිපි මඟින් තහවුරු කර ඇත. එබැවින්. මෙම ඉඩම මිලදී ගැනීම සඳහා රු. 9,280.000.00 ක මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවීම් කරන ලදී. ඒ අනුව. මෙම ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් වෘත්තීය පුහුණු අධිකාරිය පාර්ශවකරුවෙකු කරමින් අභියාචනාධිකරණයේ අංක CA/writ/307/2018 දරණ නඩුව පවරා ඇති බැවින් ඉඩමේ පවරා ගැනීම් කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇත.

තවද නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යන රාජ්‍ය ආයතන තුනෙහිම රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ නිර්දේශයන් හා එකඟතාවයන් ලැබීමෙන් අනතුරුව නිත්‍යානුකූලව ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටින අතර, මෙම නඩුවේ වර්තමාන ප්‍රගතිය විමසා 2025.06.04 වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇත.

(එ) හේනකඩුව වෙලේවත්ත

මෙම ඉඩම යාබදව ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ආධුනිකයින් සඳහා බාහිර ක්‍රියාකාරකම් සහ දෛනික ක්‍රියාකාරකම් සඳහා ඵලදායීව යොදා ගෙන ඇත. මේ වන විට නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ මෙහෙයුම් අවසන්ව ඇති බැවින් ඉදිරියේදී ප්‍රතිපාදන ලැබීම අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ සැලසුම් කරමින් පවතින කර්මාන්තපුරය ඉලක්ක කරමින් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර 2022 වර්ෂයේ අයවැය යෝජනා යටතේ රු. මි. 346 ක මුදලක් ඉදිකිරීම් කටයුතු සඳහා ද පුහුණු උපකරණ සඳහා රු.මි. 3 ක් ද ඉල්ලුම් කරන ලදී. නමුත් අදාළ ප්‍රතිපාදන නොලැබීම මත හා ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 ට අනුව නව ඉදිකිරීම් අත්හිටුවීමට කටයුතු කිරීම මත මෙහි ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට නොහැකි වී ඇත. එතෙක් මෙම ඉඩකඩ ආධුනිකයින්ගේ නායකත්ව වැඩසටහන්, දෛනික උදෑසන රැස්වීම්, ක්‍රීඩා කටයුතු සඳහා භාවිතයට ගනු ලබයි.

පානදුර මෝදරවිල

පානදුර, මෝදරවිල නව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනේ (SSDP) ප්‍රතිපාදන මත ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා ඉදිකිරීමට තෝරාගන්නා ලද නව මධ්‍යස්ථාන 20 න් එක් මධ්‍යස්ථානයකි. එම මධ්‍යස්ථාන 20 සඳහා උපදේශන ආයතන තෝරාගැනීම, සැලසුම් කිරීම, කොන්ත්‍රාත් ආයතන තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු කිරීම, ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම, කොන්ත්‍රාත් ආයතනය සඳහා ගෙවීම් කිරීම යන සියළුම කාර්යයන් ඉටුකරන ලද්දේ ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟිනි. ඒ අනුව 2017 අප්‍රේල් 4 වන දින කැබිනට් අනුමැතිය ලබා මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 225 ක මුදලක් වෙන්කර තිබිණි.

මේ සඳහා උපදේශන ආයතනය ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB) තෝරාගෙන ඇත. එම උපදේශන ආයතනය විසින් අධිකාරියේ අවශ්‍යතාවය පරිදි සැලසුම් සකස් කරන ලද අතර ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන විසින් කොන්ත්‍රාත් ආයතනයක් තෝරාගැනීමට ප්‍රසම්පාදන කටයුතු කර කොන්ත්‍රාත් ආයතනයක් තෝරා කොන්ත්‍රාත් ප්‍රදානයට සූදානම් කර තිබිණි. එහෙත් 2020 වසර තුළ ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන වෙත ප්‍රතිපාදන අනුමත කරන තුරු කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොමැත. ඉන්පසු ඇති වූ කොරෝනා වසංගතයෙන් පසු වැඩ ආරම්භ කළ අවස්ථාව වන විට ඉහත ලංසුවල වලංගු කාලය ඉක්මවා තිබුණි. එසේම 2021 වසරේ ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනේ මෙහෙයුම් කටයුතු අවසාන වීමට ද නියමිතව තිබිණි. නැවත ප්‍රසම්පාදන කටුයුතු සිදුකර කොන්ත්‍රාත් ආයතනයක් තෝරා මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළද ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනේ මෙහෙයුම් කටුයුතු අවසාන වීමට පෙර ඉහත ව්‍යාපෘතියේ වැඩ නිම කර ගෙවීම් කටයුතු නිම කිරීමට නොහැකි වන බව පෙනී ගිය හෙයින් ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් එම අවස්ථාවේ මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කර නොමැත.

එහෙයින් මෙම කාර්යය අධිකාරිය වෙත ලැබෙන වාර්ෂික භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ඉටුකර ගැනීමට SSDP වෙතින් යෝජනා කර අප වෙත ඉදිරිපත් කරන ලදී. එහෙත් ඒ සඳහා රු. මිලියන 200 ක් පමණ අවශ්‍ය වන හෙයින් සහ 2022.04.26 දින නිකුත් කරන ලද අංක BD/CBP/01/01/04-2022 දරණ චක්‍රලේඛය අනුව නව ඉදිකිරීම් ආරම්භ කිරීමද කළ නොහැකි හෙයින් එම අවස්ථාවේ ඒ සඳහා කටයුතු කර නොමැත.

මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 200 කට වැඩි මුදලක් අවශ්‍ය වන අතර අධිකාරිය වෙත වසරකට ගොඩනැගිලි ඉදිකිරීම් වැය ශීර්ෂය යටතේ ලැබෙන සීමිත ප්‍රතිපාදන තනි ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය කරන්නේ නම් එම වසර තුළ අධිකාරියේ අනෙකුත් සියළුම ඉදිකිරීම් වැඩ අත්හිටුවීමට සිදු වේ. පුහුණු මධ්‍යස්ථාන 200 කට අධික සංඛ්‍යාවක් සහිත ආයතනයක් වන අධිකාරියට එසේ කිරීමේ හැකියාවද නොමැත.

කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය සඳහා පිළියෙළ කරන ලද සැලසුම් පත්‍ර අධිකාරිය සතුව පවතින අතර, යම් විශේෂ වැඩසටහනක් හෝ ව්‍යාපෘතියක් මඟින් ප්‍රතිපාදන ලැබෙන්නේ නම් තනි ව්‍යාපෘතියක් ලෙස නිමකිරීමට හැකියාව ඇත. නොඑසේනම් ඉදිරියේදී අමාත්‍යාංශය වෙතින් ලැබෙන ප්‍රතිපාදන අනුව අදියර වශයෙන් හෝ නිමකිරීමට කටයුතු කරනු ලැබේ.

(ඒ) අයවීම් නිරවුල් කර ඇති නිලධාරීන් සංඛ්‍යාව 21 වන අතර අයකර ගැනීම් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති නිලධාරීන් සංඛ්‍යාව 33 ක් වේ.

විජිත වීරතුංග



සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය